# වාර්ෂික කාර්යසාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# Annual Performance Report
# 2020





## සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
## கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்
## Department of Animal Production and Health

# වාර්ෂික කාර්යසාධන වාර්තාව

# வருடாந்த செயலாற்றுகை அறிக்கை

# ANNUAL PERFORMANCE REPORT

# 2020


සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

கால்நடை உற்பத்தி சுகாதாரத் திணைக்களம்

**Department of Animal Production and Health**

**Peradeniya**

**Sri Lanka**

**Tel : 94 - 081 – 2388337 / 2388462**

**Fax : 94 – 081 - 2388619**

**Web Site: www.daph.gov.lk**

# පටුන

පිටු අංකය


1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

1.1. හැඳින්වීම 01

1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු 01

1.3. ප්‍රධාන කාර්යයන් 02

1.4. සංවිධාන සටහන 04

1.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ 07

1.6. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ යටතේ පවතින ආයතන 07

1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු 07

2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1. 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය 08

2.2. 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති 14

3. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය 17

3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය 18

3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය 19

3.4. මූල්‍ය ප්‍රකාශ සටහන් 20

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය 21

3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය 22

3.7. මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන 23

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය 23

3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව 24

4. කාර්යසාධන දර්ශක

4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව) 55

5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු 55

5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග 55

6. මානව සම්පත් පැතිකඩ

6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය 56

6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය/ අතිරික්තය බලපානු ලැබ බලපා ඇති ආකාරය 56

6.3. මානව සම්පත් සංවර්ධනය 57

7. අනුකූලතා වාර්තාව 59

**2020 වර්ෂය සඳහා වාර්ෂික කාර්යසාධන වාර්තාව**
**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව**

**වැය ශීර්ෂ අංකය - 292**

## 1. ආයතනික පැතිකඩ ක්‍රියාවට නැංවීමේ සාරාංශය

### 1.1. හැඳින්වීම

1978 වර්ෂයේදී ස්ථාපිත කරනු ලැබූ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනය වන අතර එය කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ පවතින, පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ. එමෙන්ම මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත්වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙතට පැවරිණි.

ජාතික සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් තාක්ෂණ නායකත්වය, විශේෂඥ සේවා සහ සහාය සේවා, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු වෙත ලබාදීමෙන් පශු සම්පත් කර්මාන්තය වෙනුවෙන් විශාල මෙහෙයක් ඉටුකරනු ලබයි. පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මගින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

### 1.2. ආයතනයේ දැක්ම, මෙහෙවර, අරමුණු

#### 1.2.1. දැක්ම

ශ්‍රී ලංකාවේ සමාජ ආර්ථික සංවර්ධනය උදෙසා පශු සම්පත් ක්ෂේත්‍රය මෙහෙයවන ප්‍රමුඛතම ආයතනය වීම.

#### 1.2.2. මෙහෙවර

නිරෝගිමත් සත්ත්ව ගහනයකින් හා ඉහළ නිෂ්පාදන ඵලදායිතාවයකින් යුක්තව ආහාර සුරක්ෂිතතාවයට දායකවීමෙන් හා ආහාරවල සෞඛ්‍යාරක්ෂිතභාවයද තහවුරු කරමින් පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් අත්පත්කර ගැනීම සඳහා තාක්ෂණික මගපෙන්වීම හා සහාය ලබාදීම.

1.2.3. අරමුණු


- සත්ත්ව රෝග වලක්වාලන සහ මර්දනය කරන කාර්යක්ෂම සත්ත්ව සෞඛ්‍ය සේවාවක් සහතික කිරීම.
- සත්ත්ව ජාන සම්පත් ප්‍රශස්ත මට්ටමින් ප්‍රයෝජනයට ගැනීම ප්‍රචලිත කිරීම.
- ගුණාත්මක සත්ත්ව ආහාර සහ ආහාර සම්පත් ප්‍රයෝජනයට ගැනීම ප්‍රචලිත කිරීම.
- සත්ත්ව ආහාර කර්මාන්තයේ වර්ධනය සහ සංවර්ධනය ප්‍රචලිත කිරීම.
- තිරසාර පශු සම්පත් සංවර්ධනයක් උදෙසා පර්යේෂණ සහ සංවර්ධන කාර්යයන් පවත්වාගෙන යාම.
- තාක්ෂණිකව සවිබල ගැන්වූ මානව සම්පත් සංවර්ධනය.
- කාර්යක්ෂමව හා ඵලදායි ලෙස තොරතුරු බෙදාහැරීම සහ තාක්ෂණික සේවා සැපයීම තහවුරු කිරීම.
- ව්‍යාපෘති හා වැඩසටහන් සැලසුම් කිරීම, මෙහෙයවීම සහ ඇගයීම.
- සත්ත්ව නිෂ්පාදනවල ආරක්ෂිතභාවය තහවුරු කිරීම.
- විධිමත් සත්ත්ව පාලන ක්‍රම ප්‍රවර්ධනය කිරීම සහ ඊට අදාළව පහසුකම් සැපයීම.
- සතුන්ගේ සුභසාධනය සහ යහපැවැත්ම තහවුරු කිරීම.
- දෙපාර්තමේන්තු කාර්යයන් කාර්යක්ෂමව කළමනාකරණය කිරීම .

1.3. ප්‍රධාන කාර්යයන්

- ඉහළ නිෂ්පාදන හැකියාවක් සහිත උසස් ආරයේ ගව හා එළු ශුක්‍ර නිෂ්පාදනය කිරීම ඇතුළු ජාතික කෘතිම සිංචන වැඩසටහන මෙහෙයවීම
- අභිජනන කටයුතු සඳහා සතුන්ගේ පෙළපත හා කාර්යසාධන වාර්තාකරණය
- සත්ත්ව ජාන සම්පත් ආරක්ෂණය
- එළුවන්ගේ ආරය නැංවීම
- වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- පෝෂ තෘණ හා සයිලේජ් නිෂ්පාදනය සහ තෘණ අලෙවිකරණය ප්‍රචලිත කිරීම
- රෝග වැලැක්වීමේ එන්නත්කරණ ජාතික වැඩසටහන ක්‍රියාත්මක කිරීම
- දේශීයව එන්නත්සාර (කුර හා මුඛ, කාලගාත්‍රා, ගව රක්තාශ්‍රව, රානිකට්) සහ අනෙකුත් ජෛවීය ද්‍රව්‍ය නිෂ්පාදනය නිෂ්පාදනය කිරීම.
- බුරුළු ප්‍රදාහය වැලැක්වීම, සුව කිරීම සහ බුරුළු නික්ෂේපන නිෂ්පාදනය
- සැල්මොනෙල්ලෝසිස් හා රානිකට් රෝග පාලනය
- අති ව්‍යාධිජනක කුරුළු උණ රෝගයට එරෙහිව කාර්යක්ෂම පූර්ව අනතුරු ඇඟවීමේ පද්ධතියක් ඇති කිරීම
- සත්ත්ව රෝග හඳුනාගැනීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා පශු විමර්ෂණ මධ්‍යස්ථාන ශක්තිමත් කිරීම
- කිරි ගොවිපොළවල සෞඛ්‍ය මට්ටම ඉහළ නැංවීම
- පරීක්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම සහ අවශ්‍යතාවයන් සැපිරීම

- කිරි තාක්ෂණ පරීක්ෂණාගාර පහසුකම් හා යටිතල පහසුකම් ඉහළ නැංවීම
- පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා විශ්ලේෂණ සහ උපදේශන සේවා සැපයීම
- ක්ෂේත්‍ර මට්ටමේ සතුන් හඳුනාගැනීමේ කටයුතු සිදුකිරීම
- දේශීය වෙළෙඳපොළ තුළ උසස් තත්ත්වයේ සත්ව ආහාර සුලභ කිරීම තහවුරු කිරීම
- පශු නිෂ්පාදන හා ජෛවී ද්‍රව්‍ය නියාමනය
- කුකුළු පාලන ක්ෂේත්‍රයට අදාළ නියාමන කටයුතු
- සත්ත්ව නිරෝධායන හා ආවේක්ෂණ කටයුතු
- අන්තර්ජාතික වෙළඳාම් පහසුකරණය
- නිරෝධායන ඒකකවල යටිතල පහසුකම් ඉහළ නැංවීම සහ පරීක්ෂණාගාර පහසුකම් ඉහළ නැංවීම
- පශු සම්පත් පර්යේෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම
- පශු සම්පත් ඩිප්ලෝමාධාරීන් බිහිකිරීම සඳහා සත්ත්ව පාලන විද්‍යාල (කරඳගොල්ල/සීප්පුකුලම) පවත්වාගෙන යාම
- සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ අඛණ්ඩ අධ්‍යාපන ආයතනයේ පුහුණු හා අධ්‍යාපන වැඩසටහන් පැවැත්වීම
- ඉලෙක්ට්‍රොනික්, මුද්‍රිත මාධ්‍ය හා ප්‍රදර්ශන මගින් තොරතුරු බෙදාහැරීම
- ආදර්ශ ගොවිපොළ ඒකක ප්‍රදර්ශන
- පශු තාක්ෂණ උද්‍යානයේ විවිධ ගොවිපොළ ඒකක සංවර්ධනය හා නඩත්තු කිරීම
- පශු සම්පත් ක්ෂේත්‍රයේ සමාජ ආර්ථික බලපෑම පිළිබඳ අධ්‍යයනයන් සිදුකිරීම
- පශු සම්පත් සංඛ්‍යාන ප්‍රකාශන සැකසීම හා බෙදාහැරීම
- පශු වෛද්‍ය සේවාව පුළුල් කිරීම සඳහා පශු වෛද්‍ය කාර්යාල ස්ථාපනය

## 1.4. සංවිධාන සටහන




**Other Staff:** BA, DO, DA, Le.Ass, Pro.Ass., Pro.Ass.Com, TO, Drftm, RA, PMA, LIB, LDO
Dri, Tra.Ope., LA, Mech, BO, Car, Elec, Ban.Kee, Watc, CatC, MM, GtC, AnC, Grs, O.E.S, Liv.Ass, GL, SL, FA

DG - අධ්‍යක්ෂ ජනරාල්
ADG - අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
D/AD - අධ්‍යක්ෂ, පරිපාලන
D/VRA - අධ්‍යක්ෂ, පශු අණපනත් හා නීති
D/LPE - අධ්‍යක්ෂ, පශු සම්පත් සැලසුම් හා ආර්ථික
D/HRD - අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන
D/AB - අධ්‍යක්ෂ, සත්ත්ව අභිජනන
D/VR - අධ්‍යක්ෂ, පශු පර්යේෂණ
D/AH - අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය
CA - ප්‍රධාන ගණකාධිකාරී
CLE - ප්‍රධාන පශු ආර්ථික විශේෂඥ
CE - ප්‍රධාන වසංගතවේදී
VPH.Sp. - පශු මහජන සෞඛ්‍ය විශේෂඥ
P.Sc - ප්‍රධාන විද්‍යාඥ
DE.Sp. - කිරිගව ඉංජිනේරු විශේෂඥ
Vet.In.Sp.- පශු විමර්ෂණ විශේෂඥ
C.Vac - ප්‍රධාන එන්නත්වේදී
R/AF - ලේඛකාධිකාරී (සත්ත්ව ආහාර)
R/VD - ලේඛකාධිකාරී (පශු ඖෂධ)
CAQO - ප්‍රධාන සත්ත්ව නිරෝධායන නිලධාරී
AB.Sp. - සත්ත්ව අභිජනන විශේෂඥ
VR.Sp. - පශු ප්‍රජනන විශේෂඥ
C.Agro. - ප්‍රධාන ශෂ්‍යවේදී

CIA - ප්‍රධාන අභ්‍යන්තර විගණක
Acct. - ගණකාධිකාරී
DD/AH - නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව සෞඛ්‍ය
DD/VR - නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු පර්යේෂණ
DD/R - නියෝජ්‍ය අධ්‍යක්ෂ, පර්යේෂණ
DD/TS - නියෝජ්‍ය අධ්‍යක්ෂ, තාක්ෂණ සේවය
DD/LPE - නියෝජ්‍ය අධ්‍යක්ෂ, පශු සම්පත් සැලසුම් හා ආර්ථික
DD/HRD - නියෝජ්‍ය අධ්‍යක්ෂ, මානව සම්පත් සංවර්ධන
DD/AB - නියෝජ්‍ය අධ්‍යක්ෂ, සත්ත්ව අභිජනන
DD/DD - නියෝජ්‍ය අධ්‍යක්ෂ, කිරිගව සංවර්ධන
LE - පශු ආර්ථික විශේෂඥ
AD.Ad - සහකාර අධ්‍යක්ෂ/ පරිපාලන
SVP - එන්නත්සාර අධිකාරී
AQO - සත්ත්ව නිරෝධායන නිලධාරී
VRO - පශු පර්යේෂණ නිලධාරී
VIO - පශු විමර්ශණ නිලධාරී
VS - පශු වෛද්‍ය නිලධාරී
LO - සත්ත්ව පාලන නිලධාරී
RO - පර්යේෂණ නිලධාරී
Leo - නීති නිලධාරී
Eng. - සිවිල් ඉංජිනේරු
AO - පරිපාලන නිළධාරී

**RA/S** - පර්යේෂණ සහකාර /විශේෂ ශ්‍රේණිය
**LPO** - පශු සම්පත් ප්‍රවර්ධන නිලධාරි
**Trl** - භාෂා පරිවර්තක
**I & CTO** - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නිලධාරි
**SO** - සංඛ්‍යාලේඛණ නිලධාරි

අනෙකුත් කාර්ය මණ්ඩලය

**BA** - අයවැය සහකාර
**DO** - සංවර්ධන නිලධාරි
**DA** - සංවර්ධන සහකාර
**Le.Ass** - නීති සහකාර
**Pro.Ass.** - වැඩසටහන් සහකාර
**Pro.Ass.Com** - වැඩසටහන් සහකාර (සන්නිවේදන)
**TO** - තාක්ෂණ නිලධාරි
**Drftm** - සැලසුම් ශිල්පී
**RA** - පර්යේෂණ සහකාර
**PMA** - රාජ්‍ය කළමණාකරණ සහකාර
**LIB** - පුස්තකාලයාධිපති
**LDO** - පශු සම්පත් සංවර්ධන නිලධාරි
**Dri** - රියදුරු
**Tra.Ope.** - ට්‍රැක්ටර් ක්‍රියාකරු
**LA** - රසායනාගාර සහායක
**Mech** - යාන්ත්‍රික ශිල්පී

**BO** - බොයිලේරුකරු
**Car** - වඩුකරු
**Elec** - විදුලි ශිල්පී
**Ban.Kee.** - බංගලා භාරකරු
**Watc** - මුරකරු
**CatC** - පට්ටිගොනුන් රැකබලාගන්නා
**MM** - කිරිකරු
**GtC** - එළුවන් රැකබලාගන්නා
**AnC** - සත්ත්ව රැකවල්කරු
**Grs** - තණකොළ කපන්නා
**O.E.S.** - කාර්යාල කාර්යය සහයක
**Liv.Ass** - සත්ත්ව පාලන සහයක
**GL** - උද්‍යාන කම්කරු
**SL** - සනීපාරක්ෂක කම්කරු
**FA** - ක්ෂේත්‍ර සහායක

### 1.5. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අංශ

- සත්ත්ව අභිජනන අංශය
- සත්ත්ව සෞඛ්‍ය අංශය
- පශු අණපනත් හා නීති අංශය
- පශු සම්පත් සැලසුම් හා ආර්ථික අංශය
- මානව සම්පත් සංවර්ධන අංශය
- පශු පර්යේෂණ අංශය
- මුදල් අංශය
- පරිපාලන අංශය

### 1.6. දෙපාර්තමේන්තුවේ එක් එක් අංශ යටතේ පවතින ආයතන

- සත්ත්ව අභිජනන අංශය
  කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන (කුණ්ඩසාලේ, පොළොන්නරුව)
  එළු අභිජනන මධ්‍යස්ථාන (තෙලහැර, ඉඹුලන්දණ්ඩ)

- සත්ත්ව සෞඛ්‍ය අංශය
  පශු විමර්ශණ මධ්‍යස්ථාන (25)

- පශු අණපනත් හා නීති අංශය
  සත්ත්ව නිරෝධායන මධ්‍යස්ථාන (කොළඹ,කටුනායක,මත්තල, යාපනය)

- මානව සම්පත් සංවර්ධන අංශය
  සත්ත්ව පාලන විද්‍යාල (කරඳගොල්ල, සීප්පුකුලම)
  අඛණ්ඩ අධ්‍යාපන ආයතනය- ගන්නෝරුව
  පශු තාක්ෂණ උද්‍යානය- ගන්නෝරුව

- පශු පර්යේෂණ අංශය
  මධ්‍යම කුකුළු පර්යේෂණ මධ්‍යස්ථානය (කරඳගොල්ල)
  සත්ව විෂාණු රසායනාගාරය- පොල්ගොල්ල
  කිරි තාක්ෂණ රසායනාගාරය- ගන්නෝරුව

### 1.7. විදේශාධාර ලබන ව්‍යාපෘතිවල තොරතුරු

2020 වර්ෂය තුළදී විදේශාධාර ලබන ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක නොවීය.

## 2. ප්‍රගතිය හා ඉදිරි දැක්ම

2.1 2020 වර්ෂය තුළදී සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් හා ව්‍යාපෘතීන්ගේ ප්‍රගතිය (දෙසැම්බර් 31 දිනට)

| අනු අංකය | වැඩසටහන / ව්‍යාපෘතිය | 2020 අයවැය ප්‍රතිපාදන (රු.මි) | භෞතික ප්‍රගතිය (%) | මූල්‍ය ප්‍රගතිය (රු.මි.) | විශේෂ කරුණු |
|---|---|---|---|---|---|
| 1. | සතුන්ගේ බෝවන රෝග වැලැක්වීමේ වැඩසටහන | 93.50 | 92 | 56.97 | |
| 2. | පශු සම්පත් පර්යේෂණ වැඩසටහන | 36.00 | 90 | 32.85 | |
| 3. | සත්ත්ව අභිජනන ව්‍යාපෘතිය | 120.00 | 76 | 110.39 | |
| 4. | වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ ව්‍යාපෘතිය | 53.50 | 86 | 43.66 | |
| 5. | පශු වෛද්‍ය කාර්යාලවල සේවා සැපයුම් පද්ධතිය වැඩිදියුණු කිරීම | 28.00 | 100 | 18.79 | |
| 6. | කුර හා මුඛ රෝග එන්නත දේශීයව නිෂ්පාදනය | 16.50 | 16 | 10.15 | පැවති කොවිඩ්- 19 වසංගත තත්වය නිසා එන්නත් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට නොහැකි වීම |
| 7. | සතුන් හඳුනාගැනීමේ වැඩසටහන | 9.50 | 58 | 2.94 | |
| 8. | සත්ත්ව නිරෝධායන ඒකක පුළුල් කිරීම හා නවීකරණය | 3.60 | 50 | 2.16 | |
| 9. | කුකුළු සෞඛ්‍ය කළමනාකරණය මඟින් කුකුළු මස් සහ බිත්තර අපනයනයට පහසුකම් සැලසීම | 9.50 | 93 | 3.68 | |
| 10. | බුරුළු ප්‍රදාහ පාලන වැඩසටහන | 5.50 | 25 | 3.91 | පැවති කොවිඩ්- 19 වසංගත තත්වය නිසා එන්නත් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීමට නොහැකි වීම |
| 11. | උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම | 110.00 | 72 | 93.30 | |
| 12. | වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන | 34.00 | 71 | 32.78 | |
| 13. | පශු විමර්ෂණ මධ්‍යස්ථාන වල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම | 9.00 | 99 | 7.84 | |
| 14. | ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු සඳහා පහසුකරණය සඳහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම | 17.50 | 85 | 6.58 | |
| 15. | සත්ව පාලන ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමේ හැකියාව ශක්තිමත් කිරීම | 2.10 | 44 | 1.82 | |
| 16. | සමාජ ආර්ථික සංවර්ධන වැඩසටහන | 3.8 | 71 | 3.62 | |
| 17. | තත්ත්ව ආරක්ෂණ වැඩසටහන | | 82 | | |
| 18. | පශු සම්පත ප්‍රචලිත කිරීමේ වැඩසටහන | | 64 | | |
| 19. | පොත් හා වාර ප්‍රකාශන | | 0 | | ප්‍රමාණවත් ප්‍රතිපාදන නොලැබීම නිසා ක්‍රියාකාරකම් සිදුකිරීමට නොහැකි විය |
| | එකතුව | 552.00 | | 431.44 | |

## 2.1. 2020 වර්ෂය තුළ ක්‍රියාත්මක කරන ලද වැඩසටහන් සහ ව්‍යාපෘතීන්හි ප්‍රගතිය

### 2.1.1. පශු සම්පත් සංවර්ධනය

#### 2.1.1.1. කිරි ගව ක්ෂේත්‍රය

**අ. සතුන්ගේ ආරය වැඩිදියුණු කිරීම සහ සතුන් අභිජනනය**

රට තුළ කිරි නිෂ්පාදනය වැඩිකිරීම උදෙසා දේශීය එළ ගව සහ මී ගව ගහනය ගුණාත්මකව වැඩිකර ගැනීමට උසස් ආරයේ ගව ශුක්‍ර භාවිතා කර කෘත්‍රිම සිංචන කටයුතු ක්‍රියාත්මක කිරීම ප්‍රධාන සත්ත්ව අභිජනන වැඩසටහන වේ. ශුක්‍ර නිෂ්පාදනය කර බෙදාහැරීම, කෘත්‍රිම සිංචන ශිල්පීන් පුහුණු කිරීම, තෘණ හා පෝෂ තෘණ වර්ග හඳුන්වාදීම හා සංවර්ධනය සහ තෘණ වගාව පිළිබඳ පුහුණුව මෙම වැඩසටහනේ ප්‍රධාන ක්‍රියාකාරකම් විය.

| සමාලෝචිත කාල සීමාව තුළදී සත්ත්ව අභිජනන වැඩසටහනේ ප්‍රගතිය | |
|---|---|
| කුණ්ඩසාලේ සහ පොළොන්නරුවේ කෘත්‍රිම සිංචන මධ්‍යස්ථාන මගින් නිෂ්පාදිත ශුක්‍ර වඩි ප්‍රමාණය | 218,835 |
| ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් සිදුකළ කෘත්‍රිම සිංචන සංඛ්‍යාව | 202,516 |
| කෘත්‍රිම සිංචනය කරන ලද එළදෙනුන් / වැස්සියන් සඳහා ගැබ් පරීක්ෂාවන් (ක්ෂේත්‍රයේ පශු වෛද්‍ය නිලධාරීන් විසින්) | 59,877 |
| වාර්තා වී ඇති පැටව් උපත් සංඛ්‍යාව | 57,051 |

**ආ. වැස්සි පැටවුන් ඇතිදැඩි කිරීමේ වැඩසටහන**

කෘත්‍රිම සිංචනයේ සැබෑ ප්‍රතිලාභ අත්කර ගැනීමට මෙන්ම ජාතික කිරි නිෂ්පාදනය වැඩිකිරීමට කෘත්‍රිම සිංචන සේවය මගින් උපත ලැබූ වැස්සි පැටවුන් නියමිත පරිදි රැකබලා ගැනීම ගොවිපොළ මට්ටමේදී බලපාන ප්‍රධාන ගැටළුවයි. රට තුළ අභිජනනයට සුදුසු වැස්සියන්ගේ ගහනය වැඩිකිරීමටද එමගින් දේශීය කිරි නිෂ්පාදනය නංවාලීමට තුඩු දෙන පරිදි කෘත්‍රීම සිංචනය මගින් උපන් වැස්සි පැටවුන් ලියාපදිංචි කර තාක්ෂණික උපදෙස් සේවාවන් සහ අවශ්‍ය යෙදවුම් සඳහා සහනාධාර ගෙවීමේ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක වේ. සමාලෝචිත කාල සීමාව තුළදී වැස්සි පැටවුන් 12,389 ක් ලියාපදිංචි කර ඇත.

#### 2.1.1.2. එළු ක්ෂේත්‍රය

උසස් ආරයේ අභිජනන එළුවන් සඳහා පවතින ඉල්ලුමට සරිලන ලෙස ඉඹුලන්දණ්ඩ සහ තෙලහැර පිහිටි එළු අභිජනන ගොවිපොළවල් දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන යනු ලැබේ. මෙම කාලය තුළදී නිෂ්පාදනය සහ ඵලදායිතාවය වැඩිකර ගැනීම උදෙසා එළු පාලනයේ නිරත ගොවීන්ට ජමුනාපාරි එළුවන් 78 දෙනෙකු ලබා දී තිබේ. තවද, එළු ගහනය වැඩිකිරීම උදෙසා 2020 දෙසැම්බර් මාසය වනවිට ක්ෂේත්‍ර මට්ටමින් කෘත්‍රිම සිංචනයන් 4,301 ක්ද සිදුකර තිබේ.

**2.1.1.3. කුකුළු ක්ෂේත්‍රය**

මෙරට කුකුළු කර්මාන්තය තුළ පෞද්ගලික අංශය සිදුකරනු ලබන කාර්යයන් හා සැසඳූ විට රාජ්‍ය අංශයේ කාර්යභාරය, නීති සහ තත්ත්ව සහතික කිරීමට පමණක් සීමාවී ඇත.

විදේශ රටවල කුරුළු උණ ව්‍යාප්ත වීම හේතුවෙන් මව්පිය සහ මුතුන් මිත්තන්ගේ පරම්පරාවලට අයත් සතුන් මෙරටට ආනයනය කිරීමේදී සීමාවන් පනවා එම රෝග මෙරටට සංක්‍රමණය වීම වැලැක්වීමට ගුවන් තොටුපල හා වරායන්හි පිහිටුවා ඇති සත්ත්ව නිරෝධායන කාර්යාල මගින් රෝග වලක්වාලීමේ විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී.

බ්‍රොයිලර් මාපිය සතුන්ගේ අවශ්‍යතාවය දේශීය නිෂ්පාදනය මගින් හා ආනයනය මගින් සපුරා ගැනේ. වර්තමානයේ බ්‍රොයිලර් මාපිය සතුන්ගේ අවශ්‍යතාවයෙන් 89.07% ක් මෙරට බ්‍රොයිලර් මුතුන් මිත්තන් ඇති කරන ගොවිපොළ 03 ක් මගින් නිපදවනු ලබයි. 2020 දෙසැම්බර් මාසය වනවිට ප්‍රගතිය පහත පරිදි වේ.

| | | |
|---|---|---|
| දේශීය නිෂ්පාදනය | - බ්‍රොයිලර් මාපිය පරම්පරාවට අයත් සතුන් | 1,244,146 |
| ආනයනය | - බ්‍රොයිලර් මුතුන් මිත්තන්ගේ පරම්පරාවලට අයත් සතුන් | 30,792 |
| | - බ්‍රොයිලර් මාපිය පරම්පරාවට අයත් සතුන් | 152,557 |
| | - ලේයර් මාපිය පරම්පරාවට අයත් සතුන් | 101,700 |

අභිජනන ගොවිපොළ මගින් මෙම කාලය තුළදී බ්‍රොයිලර් පැටවුන් මිලියන 159.78 ක් ද බිත්තර දමන කිකිළි පැටවුන් මිලියන 10.55 ක් ද නිෂ්පාදනය කරනු ලැබ ඇත. එසේම කුඩා පරිමාණ කුකුළු පාලන ගොවීන්ට නොමිලේ බෙදාදීම සඳහා පශු පර්යේෂණ ආයතනය විසින් රැනිකට් රෝගය සඳහා එන්නත් නිපදවනු ලැබේ. සමාලෝචිත කාල සීමාව තුළදී රැනිකට් එන්නත් සාර වඩි 5,916,400 ක් නිෂ්පාදනය කර ඇති අතර කුකුළන් 3,494,271 ක් සඳහා රැනිකට් එන්නත ලබාදී ඇත.

**2.1.2. සත්ත්ව සෞඛ්‍යය වැඩිදියුණු කිරීම**

**අ. සතුන්ගේ බෝවන රෝග මැඩලීම**

නිෂ්පාදනය සහ ඵලදායිතාවය ඉහළ නැංවීම සඳහා සෞඛ්‍ය සම්පන්න සත්ත්ව ගහනයක් පවත්වාගෙන යාමට මුළු දිවයින පුරා සාර්ථක අයුරින් රෝග වැලැක්වීම හා මර්දනය කිරීම පිණිස වන සත්ත්ව සෞඛ්‍ය සේවාවක් ලබාදීම උපරිම වැදගත්කමකින් යුතු වූවකි. ශ්‍රී ලංකාවේ බෝවන සත්ත්ව රෝග පැතිරීම වැලැක්වීම සඳහා එන්නත් කිරීම සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව, පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු සමග එක්වී ක්‍රියාත්මක කරන ලදී.

ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා අවශ්‍ය වන කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා සහ බෘසෙල්ලා එන්නත් පශු පර්යේෂණ ආයතනය මගින් නිෂ්පාදනය කරන ලදී. තවද කුර සහ මුඛ රෝගය සඳහා එන්නත් වඩි 675,000 ක් ආනයනය කර ඇත. සමාලෝචිත කාල සීමාව තුළදී ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිෂ්පාදනය කරන ලද එන්නත් සහ ප්‍රතිශක්තිකරණය ලබා දුන් සතුන් ගණන පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| එන්නත් වර්ගය | නිෂ්පාදනය කරන ලද එන්නත් වඩි ප්‍රමාණය | ප්‍රතිශක්තිකරණය ලබා දුන් සතුන් ගණන |
|---|---|---|
| කුර සහ මුඛ රෝග | - | 410,459 |
| රක්තාශ්‍රව රෝග | 306,570 | 279,407 |
| කාලගාත්‍රා | 125,334 | 178,243 |
| බෲසෙල්ලා | 14,000 | 8,019 |

**ආ. කුරුළු උණ මෙරටට ඇතුළුවීම වැලැක්වීම**

ආසියාවේ රටවල් කිහිපයක ආර්ථිකයට බලපෑ අතිව්‍යාධිජනක කුරුළු උණ රෝගයෙන් තොර රටක් ලෙස පැවතීමට ශ්‍රී ලංකාවට මේ දක්වා හැකියාව ලැබී ඇත. මෙරටට කුරුළු උණ ඇතුළුවුවහොත් එම රෝගය මැඩපවත්වා තුරන් කිරීමට සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් විධිමත් සැලැස්මක් සූදානම් කර ඇති අතර, මේ සම්බන්ධයෙන් රෝග ආවේක්ෂණ වැඩසටහන් හා දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වා ඇත.

පශු පර්යේෂණ ආයතනය සතු රෝග විනිශ්චය කිරීමේ පහසුකම් පුළුල් කරනු ලැබිණ. ජාතික සහ පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නිලධාරීන්ට අතිව්‍යාධිජනක කුරුළු උණ රෝගය වැලැක්වීමට සහ මැඩලීමට සම්බන්ධ පුහුණුවීම් ලබා දී ඇත.

මෙම අතිව්‍යාධිජනක කුරුළු උණ විමර්ශන වැඩසටහන යටතේ, ක්ෂේත්‍රයෙන් ලබාගත් සාම්පල 21,473 ක් මෙම කාලය තුළදී පරීක්ෂාවට භාජනය කරනු ලැබ ඇති අතර, ඒවා රෝගයෙන් තොර බවට තීරණය කෙරිණි.

**ඇ. සත්ත්ව නිරෝධායන සහ පරීක්ෂා කිරීමේ සේවාව ශක්තිමත් කිරීම**

මෙරටට යම්කිසි ආගන්තුක (විදේශීය) සත්ත්ව රෝගයක් ඇතුළුවීමට එරෙහිව ඇති පළමු ඉදිරි ආරක්ෂක ක්‍රමය සත්ත්ව නිරෝධායන සේවාවයි. අභිජනන කුකුළන් ආනයනය කිරීමෙන් පසු නිරෝධායනය කිරීමට හා අපනයන වෙළෙඳපොළ සඳහා වන විසිතුරු මත්ස්‍ය කර්මාන්තය සෞඛ්‍යාරක්ෂිතව ගුණාත්මක බවින් නගාසිටුවීමේ අරමුණින් යුතුව මෙම ව්‍යාපෘතිය 2008 දී ආරම්භ කරන ලදී.

සමාලෝචිත කාල සීමාව තුළදී මෙම වැඩසටහන යටතේ ආනයනය කළ දිනක් වයසැති කුකුළු පැටවුන් කණ්ඩායම් 44 ක් නිරෝධායන පරීක්ෂාවට භාජනය කරන ලදී. මීට අමතරව, මත්ස්‍ය ගොවිපොළවල් 28 ක්ද පරීක්ෂාවට ලක් කරන ලදී.

**ඈ. උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම**

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය මගින් උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම තවදුරටත් පුළුල් කිරීම සිදු කෙරේ. දැනට නිෂ්පාදනය කරන එන්නත් වල තත්වය වැඩිදියුණු කිරීමත්, නව එන්නත් අළුතෙන් නිෂ්පාදනයත් අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2020 වසරේදී කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා, බෲසෙල්ලා සහ රැනිකට් එන්නත් නිපදවීමට අවශ්‍ය පහසුකම් වැඩිදියුණු කර ඇත.

**ඉ. පශු විමර්ෂණ මධ්‍යස්ථානවල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ පහසුකම් වැඩිදියුණු කිරීම**

මෙම ව්‍යාපෘතිය මගින් හඳුනාගත් පශු විමර්ෂණ මධ්‍යස්ථාන වල කුකුළු හා මත්ස්‍ය රෝග හඳුනාගැනීමේ හා ආවේක්ෂණ කටයුතු ප්‍රාදේශීයව සිදුකිරීම සඳහා පරීක්ෂණාගාර නවීකරණය, පරීක්ෂණාගාර උපකරණ හා රසායනික ද්‍රව්‍ය සපයා දීම, පරීක්ෂණාගාර සේවකයන්ගේ කුසලතා සංවර්ධනය සඳහා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම ආදී කටයුතු සිදු කරනු ලැබේ. 2020 දෙසැම්බර් මාසය වනවිට මෙම ව්‍යාපෘතියෙහි භෞතික ප්‍රගතිය 99% ක් විය.

### 2.1.3. මානව සම්පත් සංවර්ධනය

**අ. හැකියා වර්ධනය, අධ්‍යාපනය සහ පුහුණුව**

දෙපාර්තමේන්තුව විසින් නවීන ප්‍රායෝගික සත්ත්ව පාලන කටයුතු සම්බන්ධයෙන් තාක්ෂණික නිලධාරීන් සහ ගොවීන්ට හැකියා වර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. සමාලෝචිත කාල සීමාව තුළදී කොරෝනා වසංගත තත්වය හේතුවෙන් දියර කිරි නිෂ්පාදනය හා සම්බන්ධ එක් පුහුණු වැඩසටහනක් පමණක් සීප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේදී පවත්වා ඇති අතර ගොවීන් 25 ක් සඳහා පුහුණුව ලබාදී ඇත.

කරඳගොල්ලේ පිහිටි ශ්‍රී ලංකා සත්ත්ව පාලන විද්‍යාලය මඟින් සිසුන් 67 දෙනකු දෑඅවුරුදු ඩිප්ලෝමා පාඨමාලාව සඳහා බඳවාගෙන ඇත (අධ්‍යයන වර්ෂ 2019 - 2021 සඳහා).

**ආ. තොරතුරු බෙදාහැරීම**

2020 වර්ෂය පුරාවට රට තුළ පැවති කොරෝනා වසංගත තත්වය හේතුවෙන් දෙපාර්තමේන්තුව ජාතික මට්ටමින් පවත්වන ලද ප්‍රදර්ශන 01 කට පමණක් සහභාගීත්වය දක්වා ඇත.

| ප්‍රදර්ශනයේ නම | පවත්වන ලද ස්ථානය |
|---|---|
| Wings of Future- 2020 | නුගවෙල විදුහල, කටුගස්තොට |


Wings of Future ප්‍රදර්ශනය - 2020


Wings of Future ප්‍රදර්ශනය - 2020

දැනට සත්ත්ව පාලන කටයුතුවල නිරතව සිටින්නාවූ කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයින්ට සහ සත්ත්ව පාලන කටයුතුවල නිරතවීමට කැමති පාසල් සිසුන් සහ මහජනතාවට නව තාක්ෂණයන් සම්බන්ධ දැනුම සහ තොරතුරු ලබාදීම සිදුකරන ලදී. සමාලෝචිත කාල සීමාව තුළදී තොරතුරු අඩංගු පොත් 13,848 ක් අලෙවි කිරීමට සහ රූපවාහිනී සහ ගුවන්විදුලි ප්‍රචාරක වැඩසටහන් 36 ක් ඉදිරිපත් කිරීමට හැකි වී ඇත.

### 2.1.4. නීතිමය කටයුතු සහ සේවාවන්

**අ. කුකුළු ගොවිපොළ ලියාපදිංචි කිරීම**

ප්‍රාදේශිය පශු වෛද්‍ය කාර්යාල මගින් කුකුළු ගොවිපොළ ලියාපදිංචි කිරීම 2020 වර්ෂයේදී ද ක්‍රියාත්මක විය. කුකුළු ගොවිපොළවල් ලියාපදිංචි කිරීමේ වැඩසටහන මගින් බෝවන රෝග මර්දනය කිරීම, තාක්ෂණික සහාය වැඩසටහන් පැවැත්වීම සහ සත්ත්ව නිෂ්පාදනවල ගුණාත්මකභාවය පාලනය කිරීම පහසුවෙන් කරගෙන යාමට හැකි වේ. ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල මගින් 2020 දෙසැම්බර් මස අවසානය වන විට ප්‍රාදේශීය නිදැලි කුකුළු ගොවිපොළවල් 99,646 ක් හා වාණිජ කුකුළු ගොවිපොළවල් 20,602 ක් ලියාපදිංචිකර ඒ සම්බන්ධව විද්‍යුත් දත්ත සමුදායක් ස්ථාපිත කර ඇත

**ආ. සතුන් හඳුනාගැනීමේ වැඩසටහන සහ මධ්‍යම දත්ත සමුදායක් ස්ථාපිත කිරීම**

මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන්ගේ කන් සලකුණු කිරීම සිදුකරනු ලබයි. සමාලෝචිත කාල සීමාව අවසන් වන විට සතුන් 81,025 දෙනෙකුගේ කන් සලකුණු සවිකර ඇත. ඉතිරි සත්ත්ව ගහනය සහ ඔවුන්ගේ පැටවුන් ඉදිරි වර්ෂවලදී හඳුනා ගැනේ. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැලැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය හා ඵලදායි නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාර වේ.

**ඇ. රජයේ පශු වෛද්‍ය කාර්යාල මගින් සිදුකරන සේවා සැපයීමේ ක්‍රමවේදය වැඩි දියුණු කිරීම**

ග්‍රාමීය ප්‍රදේශවල සත්ත්ව පාලන අංශයේ නියුතුවූවන්ගේ අවශ්‍යතාවයන් සපුරාලන ක්ෂේත්‍ර මට්ටමේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන් වනුයේ රජයේ පශු වෛද්‍ය කාර්යාලයන්ය. බිම් මට්ටමින් සේවාවන් සැපයීමේ කාර්යක්ෂමතාවය මෙකී කාර්යාලයන් සතුව පවතින පහසුකම් මත රඳා පවතී. සැලකිය යුතු පශු වෛද්‍ය කාර්යාල සංඛ්‍යාවක රෝග විනිශ්චය කිරීම, ව්‍යාප්ති සේවාවන්, සන්නිවේදනය සහ ප්‍රවාහනය සඳහා පහසුකම් පවතින්නේ අවම මට්ටමෙනි.

2019 වසරේ ආරම්භ කළ බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල පශු වෛද්‍ය කාර්යාලයේ ඉදිකිරීම් කටයුතු 2020 අවසානය වන විට සම්පූර්ණයෙන් අවසන් කර ඇත.



ඉදිකිරීම් අවසන් වූ හාලිඇල පශු වෛද්‍ය කාර්යාලය

**2.1.5. පශු මහජන සෞඛ්‍ය සේවාවන්**

**අ. ආහාර ආරක්ෂණය හා අපනයන කටයුතු පහසුකරණය සඳහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම**

2018 වසරේදී ආරම්භ කළ මෙම ව්‍යාපෘතිය හරහා සත්ව ආහාර හා පශු නිෂ්පාදන වල ගුණාත්මකභාවය සහතික කිරීම මගින් අපනයන පහසුකරණය සහ ආහාර ආරක්ෂණය තහවුරු කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ 2020 වර්ෂයේදී පශු පර්යේෂණ ආයතනයේ, සත්ත්ව පෝෂණ අංශයේ පවතින විද්‍යාගාරය වැඩි දියුණුකර ඇත. එමෙන්ම සත්ත්ව ආහාර හා සත්ත්ව නිෂ්පාදන සාම්පල 4,646 ක ගුණාත්මකභාවය විශ්ලේෂණය කර ඇත.

## 2.2. 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත වැඩසටහන් සහ ව්‍යාපෘති

### 2.2.1. පශු සම්පත් සංවර්ධනය

#### 2.2.1.1. කිරි ගව ක්ෂේත්‍රය

2020 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් 2021 වසරේදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

**අ. උසස් ආරයේ වැස්සි පැටවුන් සුලභ කිරීමේ ව්‍යාපෘතිය**

මේ යටතේ 2021 වසරේදී වැස්සියන් 13,200 ක් ලියාපදිංචි කිරීමට බලාපොරොත්තු වේ.

### 2.2.2 සත්ත්ව සෞඛ්‍ය වැඩිදියුණු කිරීම

**අ. සතුන්ගේ බෝවන රෝග මැඩලීම**

ප්‍රතිශක්තිකරණ වැඩසටහන සඳහා අවශ්‍ය වන කුර හා මුඛ, රක්තාශ්‍රව, කාලගාත්‍රා සහ බෘසෙල්ලා එන්නත් පශු පර්යේෂණ ආයතනය මගින් නිෂ්පාදනය කරනු ලබයි. 2021 කාල සීමාව තුළදී ප්‍රතිශක්තිකරණ වැඩසටහන යටතේ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව විසින් ප්‍රතිශක්තිකරණ කිරීමට බලාපොරොත්තු වන සතුන් ප්‍රමාණය පහත පරිදි වේ.

| එන්නත් වර්ගය | ප්‍රතිශක්තීකරණය කිරීමට බලාපොරොත්තුවන සතුන් ප්‍රමාණය |
|---|---|
| කුර සහ මුඛ රෝග | 800,000 |
| කාලගාත්‍රා | 180,000 |
| රක්තාශ්‍රව රෝග | 250,000 |

**ආ. උසස් තත්වයේ පශු එන්නත්සාර දේශීයව නිෂ්පාදනය කිරීම**

එන්නත් නිෂ්පාදන ක්‍රියාදාමය නවීකරණය සඳහා එන්නත් නිෂ්පාදන පරීක්ෂණාගාර සංකීර්ණය නවීකරණය කිරීම සිදු කරයි.

**ඇ. වනජීවී රෝග ආවේක්ෂණ වැඩසටහන**

වනජීවී රෝග ආවේක්ෂණය දීප ව්‍යාප්තව පුළුල් කිරීම සඳහා පිහිට වූ සම්බන්ධීකරණ ඒකකය වැඩිදියුණු කිරීම, වනජීවී රෝග ආවේක්ෂණය හා පරීක්ෂණ කටයුතු සිදු කිරීම හා නිලධාරීන් සහ පාර්ශවකරුවන් සඳහා හැකියා සංවර්ධනය සිදු කිරීමට මෙමගින් බලාපොරොත්තු වේ.

### 2.2.3. නීතිමය කටයුතු සහ සේවාවන්

**අ. සතුන් හඳුනාගැනීමේ වැඩසටහන**

සතුන් හඳුනාගැනීම සහ මධ්‍යම දත්ත සමුදායක් ස්ථාපිත කිරීම උදෙසා 2010 වසරේදී ආරම්භ කළ මෙම වැඩසටහන 2021 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ව්‍යාපෘතිය යටතේ ක්ෂේත්‍ර ව්‍යාප්ති නිලධාරීන් විසින් ලියාපදිංචි කළ ගොවිපොළ නිරීක්ෂණය කරනු ලබන අතර, ඒවායේ සිටින සතුන් 75,000 ක් සඳහා 2021 වසරේදී කන් සලකුණු කිරීමට බලාපොරොත්තු වේ. මෙය සත්ත්ව ගහනය පිළිබඳ නිරවද්‍ය දත්ත පවත්වා ගැනීම, නීති විරෝධී සතුන් ප්‍රවාහනය සහ ඝාතනය වැලැක්වීම, අනාගත කිරි නිෂ්පාදනය පුරෝකථනය සහ ඵලදායී නොවන සතුන් ඉවත් කිරීම යනාදියට උපකාරී වේ.

**ආ. සත්ත්ව සහ කුකුළු ගොවිපොළ ලියාපදිංචි කිරීම**

සත්ත්ව හා කුකුළු ගොවිපොළ ලියාපදිංචි කිරීමේ වැඩසටහන 2021 වසරේදීද අඛණ්ඩව ක්‍රියාත්මක වනු ඇත. මීට අමතරව, ගොවිපොළ ලියාපදිංචි කිරීමේ වැඩසටහන සඳහා ප්‍රාදේශීය මට්ටමේ අන්තර්ජාල පාදක දත්ත සමුදායක් නිර්මාණය කෙරේ.

**2.2.4. පශු මහජන සෞඛ්‍ය සේවාවන්**

**අ. සත්ව ආහාර වල ගුණාත්මකභාවය සහතික කිරීම**

අපනයන කටයුතු පහසුකරණය සඳහා ආහාරවල ගුණාත්මකභාවය රසායනාගාර පරීක්ෂණ මගින් තහවුරු කිරීම මෙහි අරමුණ වේ. ප්‍රමිතිගත විශ්ලේෂණ වාර්තා ලබාදීම සඳහා විශ්ලේෂණයන් සිදුකිරීමට අවශ්‍ය සත්ව පෝෂණ පරීක්ෂණාගාරය වැඩිදියුණු කිරීම හා පරීක්ෂණාගාර පහසුකම් වැඩිදියුණු කිරීම අපේක්ෂා කරයි.

**2.3. සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව මගින් 2021 වර්ෂයේදී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත නව වැඩසටහන් හා ව්‍යාපෘති**

2020 වසරේදී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන වැඩසටහන් හා ව්‍යාපෘති 2021 වසරේදී ද ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ. ඊට අමතරව, නව ව්‍යාපෘති 08 ක් සඳහා ව්‍යාපෘති යෝජනා 2020 වසරේ ජුනි මස අමාත්‍යාංශය වෙත යවා ඇත. එම ව්‍යාපෘති අතරින් පහත සඳහන් අංක 1,2,3 යන ව්‍යාපෘතීන්හි ඇතැම් ක්‍රියාකාරකම් දැනට ක්‍රියාත්මකවන අඛණ්ඩ ව්‍යාපෘති සමගින් ඉටු කිරීම සඳහා 2021 වසරේදී ප්‍රතිපාදන වෙන්වී ඇත.

| | ව්‍යාපෘතිය | කාල සීමාව | ඇස්තමේන්තු ගත මුදල (රු.මි.) | අරමුණු |
|---|---|---|---|---|
| 01 | පශු සම්පත් නිෂ්පාදන තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 5/6) ලබාගැනීමට ඉගැන්වීම්, පුහුණු පහසුකම් වැඩිදියුණු කිරීම. | අවු. 05 | 75.00 | 2020 වර්ෂයේ අවසානයට පෙර දෑ අවුරුදු සත්ත්ව පාලන ඩිප්ලෝමාව සඳහා ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ 5/6) ලබා ගැනීම. |
| 02 | දේශගුණික කලාප සඳහා අභිජනන පරාමිතීන් සැකසීම තුළින් කිරිගව ක්ෂේත්‍රයේ නිෂ්පාදනය ඉහළ නැංවීම | අවු. 05 | 18.00 | එක් එක් දේශගුණික කලාපවලට අදාලව අභිජනන පරාමිතීන් ගොඩනැගීම තුළින් කුඩා පරිමාණ කිරි ගොවිපළ නිෂ්පාදන ඉහළ නැංවීම |
| 03 | කුර හා මුඛ රෝග එන්නත් දේශීයව නිෂ්පාදනය ඉහළ නැංවීම | අවු. 05 | 455.00 | දේශීයව කුර හා මුඛ රෝග එන්නත් නිෂ්පාදනය ඉහල නැංවීම තුලින් රෝගය පාලනය සහ එමගින් සිදුවන ආර්ථික හානිය අවම කර ගැනීම |
| 04 | පශු සම්පත් ක්ෂේත්‍රයේ ව්‍යවසායක හා කුඩා ව්‍යාපාර වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැපයීම. | අවු. 05 | 18.00 | පශු සම්පත් ක්ෂේත්‍රය සඳහා යොමුවන නව ව්‍යවසායකයින්ගේ තාක්ෂණික දැනුම හා ප්‍රායෝගික කුසලතාවයන් වැඩිදියුණු කිරීම |
| 05 | තරුණ පරපුර ආකර්ශණය කර ගැනීම සඳහා කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායක මට්ටමේ ආර්ථික ඵලදායීතාවයෙන් යුතු ආදර්ශ ගොවිපළ ඇති කිරීම. | අවු. 05 | 78.00 | තරුණ පරපුර කිරි ගව ක්ෂේත්‍රයට යොමු කර ගැනීම තුළින් නිෂ්පාදනය ඉහළ නැංවීම සහ ආර්ථික වර්ධනයක් ළඟා කර ගැනීම. |
| 06 | සතුන් තුළ ප්‍රතිජීවක සඳහා ගොඩ නැගෙන ප්‍රතිරෝධතාවය වළක්වා ගැනීම මගින් මහජන සෞඛ්‍ය දියුණු කිරීම | අවු. 05 | 152.00 | සතුන් තුළ හා මහජනතාව තුල ප්‍රතිජීවක සඳහා ගොඩ නැගෙන ප්‍රතිරෝධතාවය අවම කිරීම |
| 07 | පශු විමර්ශණ පහසුකම් සහ ජෛව ආරක්ෂණ මට්ටම ඉහළ දැමීම සඳහා මධ්‍යම පශු විමර්ශණ මධ්‍යස්ථාන වැඩිදියුණු කිරීම. | අවු. 05 | 200.00 | මධ්‍යම පශු විමර්ශණ මධ්‍යස්ථාන මගින් සපයන සේවාවන් වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම. |
| 08 | සත්ත්ව සෞඛ්‍ය වැඩිදියුණු කිරීම | අවු. 05 | 60.00 | මහා පරිමාණ හා වාණිජ ගොවිපළ වල ජෛව ආරක්ෂණය ඉහළ නැංවීම තුළින් සත්ත්ව සෞඛ්‍ය ප්‍රවර්ධනය සහ රෝග පැතිර යාම අවම කිරීම |

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය හා ඉදිරි දැක්මට අදාළව දෙවන පරිච්ඡේදය මගින් ඉදිරිපත් කර ඇති තොරතුරු සත්‍ය බව සහතික කරමි.

Hemal Abey

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

## 3. 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වූ වසර සඳහා වන සමස්ත මූල්‍ය කාර්යසාධනය

### 3.1. මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

ඒසීඒ-එෆ්

2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය

රු.

| අයවැය 2020 | | සටහන | සත්‍ය 2020 | 2019 | |
|---|---|---|---|---|---|
| - | ආදායම් ලැබීම් | | | - | |
| - | ආදායම් බදු | 1 | - | - | ඒසීඒ-1 |
| - | දේශීය භාණ්ඩ හා සේවා මත බදු | 2 | - | - | |
| - | ජාත්‍යන්තර වෙළඳාම මත බදු | 3 | - | - | |
| - | බදු නොවන ආදායම් හා වෙනත් | 4 | 81,415,040 | 84,973,991 | |
| - | **මුළු ආදායම් ලැබීම් (අ)** | | **81,415,040** | **84,973,991** | |
| - | ආදායම් නොවන ලැබීම් | | | | |
| - | භාණ්ඩාගාර අග්‍රිම | | 1,030,373,000 | 1,303,570,000 | ඒසීඒ-3 |
| - | තැන්පතු | | 8,582,723 | 17,096,397 | ඒසීඒ-4 |
| - | අත්තිකාරම් ගිණුම | | 27,359,955 | 31,253,172 | ඒසීඒ-5/5(ඒ)/5(බී) |
| - | වෙනත් ලැබීම් | | - | - | |
| - | **මුළු ආදායම් නොවන ලැබීම් (ආ)** | | **1,066,315,678** | **1,351,919,569** | |
| - | **මුළු ආදායම් ලැබීම් සහ ආදායම් නොවන ලැබීම් ඇ = (අ)+(ආ)** | | **1,147,730,718** | **1,436,893,560** | |
| | **අඩුකළා : වියදම්** | | | | |
| - | **පුනරාවර්තන වියදම්** | | | | |
| 531,200,000 | වැටුප්, වේතන සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ | 5 | 509,619,694 | 463,208,230 | ඒසීඒ-2(ii) |
| 99,700,000 | අනෙකුත් භාණ්ඩ හා සේවා | 6 | 91,095,818 | 96,251,756 | |
| 16,400,000 | සහනාධාර, ප්‍රදාන සහ මාරුකිරීම් | 7 | 15,455,155 | 21,248,032 | |
| - | පොලී ගෙවීම් | 8 | - | - | |
| - | වෙනත් පුනරාවර්තන වියදම් | 9 | - | - | |
| 647,300,000 | **මුළු පුනරාවර්තන වියදම් (ඈ)** | | **616,170,667** | **580,708,018** | |
| | **මූලධන වියදම්** | | | | |
| 22,250,000 | මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම් | 10 | 21,289,840 | 42,777,576 | ඒසීඒ-2(ii) |
| 7,450,000 | මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | 11 | 2,947,881 | 11,855,517 | |
| - | ප්‍රාග්ධන මාරුකිරීම් | 12 | - | - | |
| - | මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම් | 13 | - | - | |
| 24,000,000 | හැකියා වර්ධනය | 14 | 23,588,023 | 32,669,051 | |
| 552,000,000 | වෙනත් මූලධන වියදම් | 15 | 433,532,094 | 706,155,928 | |
| 605,700,000.00 | **මුළු මූලධන වියදම් (ඉ)** | | **481,357,838** | **793,458,071** | |
| | ප්‍රධාන ලෙජර් වියදම් (ඊ) | | 46,371,830 | | |
| | තැන්පතු ගෙවීම් | | 18,130,124 | 13,854,269 | ඒසීඒ-4 |
| | අත්තිකාරම් ගෙවීම් | | 28,241,706 | 42,225,575 | ඒසීඒ-5/5(ඒ)/5(බී) |
| | **මුළු වියදම් උ = (ඈ+ඉ+ඊ)** | | **1,143,900,335** | **1,430,245,933** | |
| | **2020 දෙසැම්බර් 31 දිනට අග්‍රිම ශේෂය ඌ = (ඇ-උ)** | | **3,830,383** | **6,647,627** | |

1

කේ. සරත්
ප්‍රධාන ගණකාධිකාරී
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## 3.2. මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය

ඒසීඒ-8

**2020 දෙසැම්බර් 31 දිනට**
**මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය**

| | | තත්‍ය | |
|---|---|---|---|
| | සටහන | **2020** | **2019** |
| | | රු. | රු. |
| <u>මූල්‍ය නොවන වත්කම්</u> | | | |
| දේපළ, පිරියත හා උපකරණ | ඒසීඒ-6 | 2,592,330,789 | 2,380,948,039 |
| <u>මූල්‍ය වත්කම්</u> | | | |
| අත්තිකාරම් ගිණුම් | ඒසීඒ-5/5(ඒ) | 104,381,710 | 103,499,959 |
| මුදල් හා මුදල් සමාන දෑ | ඒසීඒ-3 | - | 2,083,899 |
| මුළු වත්කම් | | **2,696,712,499** | **2,486,531,897** |
| <u>ශුද්ධ වත්කම් / ස්කන්ධය</u> | | | |
| ශුද්ධ වත්කම් | | 88,823,336 | 78,394,185 |
| දේපළ පිරියත හා උපකරණ සංචිතය | | 2,592,330,789 | 2,380,948,039 |
| කුලී හා වැඩ අත්තිකාරම් සංචිතය | ඒසීඒ-5(බී) | | |
| <u>ජංගම වගකීම්</u> | | | |
| තැන්පතු ගිණුම් | ඒසීඒ-4 | 15,558,374 | 25,105,774 |
| අග්‍රිම ශේෂය | ඒසීඒ-3 | - | 2,083,899 |
| මුළු වගකීම් | | **2,696,712,499** | **2,486,531,897** |

පිටු අංක..........සිට ......... දක්වා ඒසීඒ 1 සිට ඒසීඒ 6 දක්වා වූ ආකෘති පත්‍රවලින් ඉදිරිපත් කෙරෙන ගිණුම් තොරතුරු සහ සටහන් පිටු අංක .......... සිට .......... දක්වා ඇතුළත් ගිණුම් සටහන් විස්තර ද මෙම අවසන් ගිණුමෙහිම අන්තර්ගත කොටස් වේ. මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සිදුකර ඇති අතර මෙහිදී මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් මගින් හෙළිදරව් කර ඇති පරිදි වඩාත් සුදුසු ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කර ඇත. ඉහත අවසන් ගිණුමෙහි සඳහන් සංඛ්‍යා, ඊට අදාළ ගිණුම් සටහන් හා අනෙකුත් ගිණුම් තොරතුරු භාණ්ඩාගාර ගිණුම් පොත් සමඟ සැසඳීම කර ඇති බවටත් ඒවා එම සංඛ්‍යා සමඟ එකඟ වන බවටත් මෙයින් සහතික කරමු.

........................
ප්‍රධාන ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :2021.02. 22

එස්. සේනානායක
ලේකම්
පශු සම්පත්, ගොවිපොළ ප්‍රවර්ධන සහ
කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය
අංක.80/5, බිම් මහල, "ගොවිජන මන්දිරය",
රජමල්වත්ත පටුමග, බත්තරමුල්ල.

........................
ගණන්දීමේ නිලධාරි
නම :
තනතුර :
දිනය :2021.02.19

වෛද්‍ය ආර්. හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

........................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ප්‍රධාන ගණකාධිකාරි/
අධ්‍යක්ෂ (මුදල්)/ කොමසාරිස් (මුදල්)
නම :
දිනය :2021.02.21

කේ. සරත්
ප්‍රධාන ගණකාධිකාරි
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

## 3.3. මුදල් ප්‍රවාහ පිළිබඳ ප්‍රකාශය

### මුදල් ප්‍රවාහ ප්‍රකාශය

| | 2020<br>රු. | 2019<br>රු. |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| මුළු බදු ලැබීම් | - | - |
| ගාස්තු, අධිභාර, දඩමුදල් සහ බලපත්‍ර | - | - |
| ලාභ | - | - |
| ආදායම් නොවන ලැබීම් | 43,722,246 | 51,154,589 |
| වෙනත් දෙපාර්තමේන්තු/අමාත්‍යාංශ මගින් එකතු කරන ලද ආදායම් | - | - |
| අග්‍රිම ලැබීම් | 1,030,373,000 | 1,303,570,000 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (අ) | 1,074,095,246 | 1,354,724,589 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් | 542,864,525 | 407,497,147 |
| සහනාධාර සහ මාරුකිරීම් | 15,380,648 | 113,412,980 |
| වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් | 2,786,313 | 1,587,591 |
| භාණ්ඩාගාරයට පියවන ලද අග්‍රිම | 2,083,899 | - |
| මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුදල් ප්‍රවාහය (ආ) | 563,115,385 | 522,497,718 |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (ඇ )=(අ)-(ආ) | 510,979,861 | 832,226,871 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| පොළී | - | - |
| ලාභාංශ | - | - |
| හිමිකම් ඉවත්වීමේ ප්‍රතිපාදන හා භෞතික වත්කම් විකිණීම | - | - |
| උප ණය අයකර ගැනීම් | - | - |
| අත්තිකාරම් අයකර ගැනීම් | 2,574,516 | 916,795 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඈ) | 2,574,516 | 916,795 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| භෞතික වත්කම් ඉදිකිරීම් හෝ මිලදී ගැනීම් හා වෙනත් ආයෝජන අත්කර ගැනීම් | 481,202,354 | 784,735,323 |
| අත්තිකාරම් ගෙවීම් | 23,806,008 | 39,595,420 |
| ආයෝජන ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (ඉ) | 505,008,362 | 824,330,743 |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය ( ඊ)=(ඈ)-(ඉ) | (502,433,846) | (823,413,948) |
| මෙහෙයුම් හා ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය (උ)=( ඇ) + (ඊ) | 8,546,015 | 8,812,923 |
| **මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහයන්** | | |
| දේශීය ණය ගැනීම් | - | - |
| විදේශීය ණය ගැනීම් | | - |
| ප්‍රදානයන් ලැබීම් | - | - |
| තැන්පතු ලැබීම් | 4,947,591 | 6,291,257 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුළු මුදල් ප්‍රවාහය (ඌ) | 4,947,591 | 6,291,257 |
| **අඩුකළා : මුදල් වැය කිරීම්** | | |
| දේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| විදේශීය ණය ආපසු ගෙවීම් | - | - |
| තැන්පතු ගෙවීම් | 15,577,505 | 13,020,282 |
| මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා වැය කරන ලද මුළු මුදල් ප්‍රවාහය (එ) | 15,577,505 | 13,020,282 |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වූ මුදල් ප්‍රවාහය (ඒ)=(ඌ)-(එ) | (10,629,914) | (6,729,025) |
| මුදල්වල ශුද්ධ වෙනස්වීම් (ඔ) = (උ) -(ඒ) | (2,083,899) | 2,083,899 |
| ජනවාරි 01 දිනට ආරම්භක මුදල් ශේෂය | 2,083,899 | - |
| දෙසැම්බර් 31 දිනට අවසාන මුදල් ශේෂය | - | 2,083,899 |

3

කේ. ශර්ත
ප්‍රධාන ගණකාධිකාරී
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13
ගැටඹේ - පේරාදෙණිය

**3.4. මූල්‍ය ප්‍රකාශ සටහන්**

**1. වාර්තාකරණ කාලපරිච්ඡේදය**

2020 ජනවාරි 01 සිට දෙසැම්බර් 31 දක්වා වූ කාලපරිච්ඡේදය මෙම මූල්‍ය ප්‍රකාශයන්ට අදාළ වාර්තාකරණ කාලපරිච්ඡේදය වේ.

**2. මිනුම්කරණ පදනම**

මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය මත පිළියෙල කර ඇති අතර, සමහර වත්කම්වල ඓතිහාසික පිරිවැය නැවත තක්සේරු කරන ලද වටිනාකමට වැඩිදියුණු කර ඇත. අන්‍යාකාරයෙන් දක්වා නොමැති විට ගිණුම් පිළියෙල කිරීම වැඩිදියුණු කළ මුදල් පදනම මත සිදුකරයි. මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ආසන්නතම රුපියලට ඉදිරිපත් කර ඇත.

**3. ආදායම් හඳුනාගැනීම**

හුවමාරු හා හුවමාරු නොවන ආදායම් ඒවා ලැබිය යුතු කාල සීමාව නොසලකා, මුදල් ලැබෙන කාල පරිච්ඡේදයේදී ආදායම් ලෙස හඳුනාගනු ලැබේ.

**4. දේපළ, පිරියත හා උපකරණ හඳුනාගැනීම හා මැනීම**

වත්කමට අදාළ අනාගත ආර්ථික ප්‍රතිලාභ ආයතනයට ලැබෙන බවට තහවුරුවක් ඇති විට හා එම වත්කම් විශ්වාසනීයව මැනිය හැකි නම් එම වත්කම් දේපළ, පිරියත හා උපකරණ ලෙස හඳුනාගනු ලැබේ. දේපළ, පිරියත හා උපකරණ පිරිවැයට හඳුනා ගන්නා අතර, පිරිවැය ආකෘතිය අදාළ නොවන අවස්ථා වලදී නැවත තක්සේරු කරන ලද අගය යොදා ගනී.

**5. දේපළ, පිරියත හා උපකරණ සංචිතය**

මෙම සංචිත ගිණුම, දේපළ, පිරියත හා උපකරණවල අනුරූප ගිණුමවේ.

**6. මුදල් හා මුදල් සමාන දෑ**

2020 දෙසැම්බර් 31 දිනට අතැති දේශීය ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි වලින් මුදල් හා මුදල් සමාන දෑ සමන්විත වේ.

3.5. ආදායම් එකතු කිරීමේ කාර්යසාධනය

ඒඕඒ - 1(iii)

## සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව සහ සත්‍ය ආදායම අතර විචලතා පැහැදිලි කිරීම

ආදායම් ගණන් දීමේ නිලධාරි :

වියදම් ශීර්ෂ අංකය : 292

රු.

| ආදායම් සංකේතය | විස්තරය | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව | සත්‍ය ආදායම | සංශෝධිත ආදායම් ඇස්තමේන්තුව හා සත්‍ය ආදායම අතර වෙනස | වෙනස සංශෝධිත ආදායම් ඇස්තමේන්තුවේ % ලෙස | වෙනස්කම්වලට හේතු |
|---|---|---|---|---|---|---|
| 2002.01.01 | රජයේ ගොඩනැගිලි කුලී | 6,100,000 | 7,684,318 | 1,584,318 | 25.97 | මෙම ආදායම් ශීර්ශ සඳහා ඇස්තමේන්තු සකස් කිරීම ප්‍රායෝගික අපහසු නිසා මෙම විචලතාවය ඇති විය. |
| 2002.02.99 | පොළිය හා අනෙකුත් | 3,000,000 | 2,910,554 | (89,446) | (2.98) | |
| 2003.01.00 | විකුණුම් ගාස්තු හා දෙපාර්තමේන්තු විකුණුම් | 45,000,000 | 1,753,414 | (43,246,586) | (96.10) | |
| 2003.02.99 | විවිධ | 3,000,000 | 1,323,861 | (1,676,139) | (22.53) | |
| 2003.99.00 | විකුණුම් ගාස්තු හා අනිකුත් ලැබීම | 30,000,000 | 44,792,146 | 14,792,146 | 49.30 | |

.................
දිනය
2021.02.19

..........................................
ප්‍රධාන මූල්‍ය නිලධාරි/ ප්‍රධාන ගණකාධිකාරි/
මුදල් අංශයේ ප්‍රධානී නම සහ අත්සන

ප්‍රධාන ගණකාධිකාරී
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13
ගැටඹේ - පේරාදෙණිය

..........................................
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ අත්සන
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ නම:
ආදායම් ගණන්දීමේ නිලධාරියාගේ තනතුර:

වෛද්‍ය ආර්. හෙට්ටිආරච්චි
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

## 3.6. වෙන් කරන ලද ප්‍රතිපාදන උපයෝගී කර ගැනීමේ කාර්යසාධනය

ඒසීඑ -2

### 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශය

වැය ශීර්ෂ අංකය : 292

අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නම : සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

රු.

| වාර්ෂික ඇස්තමේන්තුවේ සඳහන් පරිදි වැඩසටහන් අංකය | වියදමෙහි නම | අයවැය ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (1) | පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන (2) | මු.රෙ. 66/69 මාරු කිරීම (3) | මුළු ශුද්ධ ප්‍රතිපාදන (4)=(1)+(2)+(3) | මුළු වියදම (5) | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය /(ඉක්මවීම) (6)=(4)-(5) |
|---|---|---|---|---|---|---|---|
| වැඩසටහන (1) | (1) පුනරාවර්තන | 647,300,000 | | | 647,300,000 | 616,170,667 | 31,129,333 |
| | (2) ප්‍රාග්ධන | 57,500,000 | | | 57,500,000 | 51,449,319 | 6,050,681 |
| | උප එකතුව | 704,800,000 | - | - | 704,800,000 | 667,619,986 | 37,180,014 |
| වැඩසටහන (2) | (1) පුනරාවර්තන | | | | | | |
| | (2) ප්‍රාග්ධන | 548,200,000 | | | 548,200,000 | 429,908,519 | 118,291,481 |
| | උප එකතුව | 548,200,000 | - | - | 548,200,000 | 429,908,519 | 118,291,481 |
| | මුළු එකතුව | 1,253,000,000 | - | - | 1,253,000,000 | 1,097,528,505 | 155,471,495 |

........................................
ප්‍රධාන මූල්‍ය නිලධාරී/ ප්‍රධාන ගණකාධිකාරී/
අධ්‍යක්ෂ (මුදල්) /කොමසාරිස් (මුදල්)
දිනය :2021.02.19

කේ. සරත්
ප්‍රධාන ගණකාධිකාරී
සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ. පෙ. 13
ගැටඹේ - පේරාදෙණිය

3.7. මු.රෙ. 208 ප්‍රකාරව වෙනත් අමාත්‍යාංශ /දෙපාර්තමේන්තුවල නියෝජිතයෙකු ලෙස මෙම දෙපාර්තමේන්තුවට/දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට/පළාත් සභාවට ප්‍රදානය කරන ලද ප්‍රතිපාදන

| | ප්‍රතිපාදන ලද අමාත්‍යාංශය දෙපාර්තමේන්තුව | ප්‍රතිපාදනයේ අරමුණ | ප්‍රතිපාදන | | තත්‍ය වියදම | උපයෝගී කර ගන්නා ලද ප්‍රතිපාදන, ලබා දුන් අවසාන ප්‍රතිපාදනවල % ලෙස |
|---|---|---|---|---|---|---|
| | | | මුදල් ප්‍රතිපාදන | අවසාන ප්‍රතිපාදන | | |
| 01 | රාජ්‍ය සේවා, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය | අභ්‍යාසලාභී, උපාධි පුහුණු ලාභීන්ගේ දීමනා ගෙවීම සඳහා | 240,000 | | 240,000 | 100% |
| 02 | මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශය | | 360,000 | | 360,000 | 100% |

3.8. මූල්‍ය නොවන වත්කම් වාර්තා කිරීමේ කාර්යසාධනය

| වත්කම් කේතය | කේත විස්තරය | 2020.12.31 දිනට භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ශේෂය | 2020.12.31 දිනට මූල්‍ය තත්ත්ව වාර්තාව අනුව ශේෂය | ඉදිරියේදී ගිණුම්කරණයට නියමිත | ප්‍රගතිය % ලෙස වාර්තා කිරීම |
|---|---|---|---|---|---|
| 9151 | ගොඩනැගිලි හා ව්‍යුහයන් | - | 912,811.814 | - | - |
| 9152 | යන්ත්‍රෝපකරණ | - | 301,467.976 | - | - |
| 9153 | ඉඩම් | - | 1,292,997.469 | - | - |

### 3.9. විගණකාධිපතිවරයාගේ වාර්තාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. : සීඑල්පීඑල්/නේඩිපීඑච්/ඩීඒපීඑච්/ඒ/2021/20
ඔබේ අංකය / உமது இல. / Your No. :
දිනය / திகதி / Date : 2021 මැයි 21 දින

ගණන්දීමේ නිලධාරී
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව.

**සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව**

---

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශනය එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේනම් ඒ බවද මා වෙත දන්වා එවිය යුතුය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) මූලධන වියදම්

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තු පොත් අනුව ශේෂ, භාණ්ඩාගාර පොත් අනුව ශේෂ (එස්ඒ-10) සමඟ සැසඳිය යුතු වුවද පහත සඳහන් නොසැසඳීම් නිරීක්ෂණය විය. | | |

2

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | | |
|---|---|---|---|
| (i) | මූලධන වැය විෂයයන් දෙකක දෙපාර්තමේන්තු පොත් අනුව මුළු වියදම් හා භාණ්ඩාගාර පොත් අනුව මුළු වියදම් අතර රු.2,097.560 ක වෙනසක් පැවතුණි. | භාණ්ඩාගාර පොත් සමඟ දෙපාර්තමේන්තු පොත් සැසඳීමට කටයුතු කළ යුතු වීම. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. |
| (ii) | දෙපාර්තමේන්තු පොත් අනුව 292-2-3-17-2507 වැය විෂයයේ ඉතිරියක් නොමැති වුවද භාණ්ඩාගාර පොත් අනුව රු. 284,081 ක ඉතිරියක් පැවතුණි. (ඕඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑපීඑච්/ඒ/2021/20) | භාණ්ඩාගාර පොත් සමඟ දෙපාර්තමේන්තු පොත් සැසඳීමට කටයුතු කළ යුතු වීම. | නිවැරදි කිරීමට කටයුතු කරන බව. |

(ආ) දේපළ පිරියත හා උපකරණ

දේපළ පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | ඉකුත් වර්ෂයේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් ශේෂ සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයේ ඇතුළත් කිරීමේදී ප්‍රධාන ලෙජර් වියදම් 3 ක ශේෂ හා මූල්‍ය නොවන වත්කම් විෂයයන් 10 ක ශේෂ වල රු. 129,262,877ක වෙනස්කම් පැවති අතර එම වෙනස්කම් මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිකර නොතිබුණි. | ඉකුත් වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පැවති ශේෂ සංශෝධනය කරන්නේ නම් ඒවා ජර්නල් සටහන් මගින් තහවුරු කළ යුතු වීම. | ඉදිරියේදී නිවැරදි කර ගැනීමට කටයුතු කරන බව. |
| (ii) | මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනය අනුව දේපල පිරියත හා උපකරණවල වටිනාකම රු.2,592,330,789 ක් වූ නමුත් භාණ්ඩාගාර පොත් අනුව (SA - 82) එය රු.2,507,277,259 ක් වූයෙන් රු.85,053,530 ක නොසැසඳීමක් විය. | භාණ්ඩාගාර පොත් සමඟ දෙපාර්තමේන්තු පොත් සැසඳීමට කටයුතු කළ යුතු වීම. | නිවැරදි කරන ලෙස මහා භාණ්ඩාගාරය වෙත ලිඛිතව දැනුම් දී ඇති බව. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | | |
|---|---|---|---|
| (iii) | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශනයෙහි මිලදී ගැනීම්වල එකතුව රු.112,977,257 ක් වුවද අංක 2102, 2103, 2104 හා 2105 වැය විෂයයන් යටතේ මිලදී ගැනීම් වටිනාකම රු.2,947,881 ක් වූ බැවින් රු.110,029,376 ක නොසැසඳීමක් විය. (සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඒපීඑච්/ඒ/2021/20) | නිවැරදි අගයන් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළයුතු වීම. | පිළිගන්නා බව. |

(ඇ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන විධිමත්ව පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (i) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. (සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඒපීඑච්/ඒ/2021/20) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකිවන පරිදි බැරකම් ලේඛනයක එම බැරකම් සටහන් කළ යුතුය. | සිගාස් පරිගණක වැඩසටහන මගින් ගෙවීමට අදාළ සියළු වවුචර්පත් බැඳීමක් සහ බැරකමක් ලෙස ඇතුළත් කරන බැවින් එය පරිගණක ආශ්‍රයෙන් නඩත්තු වන බව. |
| (ii) | 2009 පෙබරවාරි 20 දිනැති අංක 1589/30 දරන අති විශේෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීති ප්‍රකාරව පවත්වා ගත යුතු පහත සඳහන් ලේඛන පවත්වා නොතිබුණි. | අදාළ ලේඛන යාවත්කාලීනව පවත්වාගැනීමට කටයුතු කළ යුතු වීම. | විෂයය භාර නිලධාරීන් විසින් යාවත්කාලීන කරමින් පවත්වාගෙන යාමට කටයුතු කරමින් පවතින බව. |

(i) පත්කිරීම හා උසස්කිරීම
(ii) සේවයෙන් පහකළ නිලධාරීන්
(iii) සේවයෙන් ඉල්ලා අස්වූ නිලධාරීන්
(iv) තනතුර අතහැර ගිය නිලධාරීන්
(v) වැඩ තහනම්කර ඇති නිලධාරීන්
(vi) විශ්‍රාම ගන්වනු ලැබූ නිලධාරීන්
(සීඑල්පීඑල්/කේඩී/එච්/ ඩීඒපීඑච්/ඒ/2020/15)

2.5 (ඇ)

(ඇ) ගණන්දීමේ නිලධාරී විසින් සිදුකළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරීන් විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම කළ යුතුව තිබුණත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස්කර පවත්වාගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරි සහතික වියයුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳ කලින් කල සමාලෝචනය කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදුකර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයක් සිදුකළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. |

NAOSL
ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

5

(ඉ) නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | නිරීක්ෂණය | | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| | වටිනාකම | අනුකූල නොවීම | | |
| (i) ව්‍යවස්ථාපිත විධිවිධාන | | | | |
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ii කොටසේ 7(1)(ආ) වගන්තිය | --- | විගණන නිලධාරීන් විසින් කරනු ලබන පරීක්ෂණවලට අදාළව ලිඛිත ප්‍රකාශ ලබාදෙන ලෙස ඉල්ලා සිටි විට ඒවා ලබාදීමට විගණිත ආයතන බැඳී සිටින නමුත් විගණන නිලධාරීන් විසින් සත්ත්ව සෞඛ්‍ය අංශයට අයත් ගබඩාව පරීක්ෂා කිරීමේදී අනාවරණය වූ භෞතික ශේෂයන් පිළිබඳව ලිඛිත ප්‍රකාශනයක් ලබා දීමට අදාළ නිලධාරීන් කටයුතු කර නොතිබුණි. (ඕඑල්පීඑල්/කේඩී/එච්/ඩීපීඑච්/ජී/2020/14) | පනතේ විධිවිධානවලට අනුගත වීම. | පිළිගන්නා බව. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL



| | | | |
|---|---|---|---|
| (ii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | | | |
| i. XII පරිච්ඡේදයේ 1.2 , 1.3 සහ 22 වගන්ති | නිවාඩු ලබාගැනීමට පෙර අනුමත කරගත යුතු නමුත් සිප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේ සේවය කරන නිලධාරියෙකු නිවාඩු අනුමත කරගැනීමකින් තොරව 2016 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා කාලය තුළදී දින 306 ක් වැටුප් රහිත නිවාඩු ලබාගෙන තිබුණි. (සිඑල්පිඑල්/කේඩී/එච්/ඩීඒපීඑච්/ඒ/2019/42) | ආයතන සංග්‍රහයේ විධිවිධාන අනුව කටයුතු කළයුතු වීම. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව. |
| ii. XXVIII පරිච්ඡේදයේ 1.3 වගන්තිය | සෑම නිලධාරියෙකුම පැමිණෙන හා පිටවන වේලාව ස්වකීය අත්සන ද සහිතව පැමිණීමේ ලේඛනයේ සටහන් කළ යුතු වුවද නිලධාරීන් 13 දෙනෙකු විසින් දින 31 කදී පැමිණීම හා පිටවීම අත්සන් කර නොතිබුණි. (සිඑල්පිඑල්/කේඩී/එච්/ඩීඒපීඑච්/ඒ/2020/10) | ආයතනයේ විධිවිධාන අනුව කටයුතු කළයුතු වීම. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට නිලධාරීන්ට උපදෙස් ලබාදුන් බව. |
| (III) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | | | |
| i. මුදල් රෙගුලාසි 155 | විගණකාධිපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරනු ලබන නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලබන විගණන විමසුම් සඳහා අප්‍රමාද ව ක්‍රියාකර සම්පූර්ණ පිළිතුරු සැපයීම ගණන්දීමේ නිලධාරියාගේ | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළයුතු වීම. | ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව පිළිතුරු සැපයීමට කටයුතු කරන බව. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

7

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | වගකීමක් වන නමුත් 2017 වර්ෂයේ සිට වසර 03 ක් තුළ නිකුත් කළ විගණන විමසුම සඳහා දින 48 සිට දින 196 දක්වා ප්‍රමාද වී පිළිතුරු සපයා තිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑපීඑච්/ඒ/2021/20) | | |
| ii. | මුදල් රෙගුලාසි 571(3) | රු.1,670,327 | වර්ෂ 02 ක කාලයක් ඉක්ම වූ තැන්පතු ශේෂ 07 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑපීඑච්/ඒ/2021/12) | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2021 අප්‍රේල් වන විට ගෙවා අවසන් කර ඇති බව.. |
| iii. | මුදල් රෙගුලාසි 880(1) | -- | කරදගොල්ල සතුන් පර්යේෂණ මධ්‍යස්ථානයේ ඇප තැබිය යුතු නිලධාරීන් 03 දෙදෙනකුගෙන් ඇප ලබාගෙන නොතිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑපීඑච්/ඒ/2020/08) | මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. | 2021 අප්‍රේල් මස සිට අදාළ නිලධාරීන්ගෙන් ඇප අයකර ගැනීම් සඳහා ගිණුම් අංශය වෙත දන්වා ඇති බව. |
| iv | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | | සෑම ඉන්ධන පරීක්ෂාවකටම පසු මාස 12 ක කාලසීමාවකින් පසුව හෝ කිලෝමීටර් 25,000 ක දුර ප්‍රමාණයක් [illegible] කිරීමෙන් පසුව හෝ එන්ජිමට සම්බන්ධ ප්‍රධාන අලුත්වැඩියාවකට පසුව හෝ යන කාරණා අතරින් මුලින්ම යෙදෙන අවස්ථාවට පසු නැවත ඉන්ධන | චක්‍රලේඛය ප්‍රකාරව ඉන්ධන ඇවිම පරීක්ෂා කළ යුතු වීම. | ඉදිරියේදී එම පරීක්ෂාවන් ඉන්ජිනේරුවරයෙකු ලවා සිදු කිරීමට අදාළ අංශ වෙත උපදෙස් ලබාදුන් බව. |

8

| | | |
|---|---|---|
| | පරීක්ෂාව සිදු කල යුතු වුවද වාහන 05 ක එලෙස ඉන්ධන පරීක්ෂාව සිදු කර නොතිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑපීඑච්/ඒ/2020/20) | |

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමණාකරණය

(2.1)

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| වාර්ෂික අයවැය ලේඛනය මගින් ශීර්ෂ අංක 292 - සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව සඳහා සමාලෝචිත වර්ෂය වෙනුවෙන් රු. 1,253,000,000 ක ප්‍රතිපාදන සලසා තිබුණු නමුත් ඒ සඳහා නිදහස් කර තිබුණේ රු. 1,147,730,718 ක අග්‍රිම මුදල් පමණක් බැවින් රු.105,269,282 ක වෙනසක් පැවතුණි. මේ අනුව ප්‍රමාණවත් මුදල් නොලැබීම නිසා වැය විෂයයන් 3 ක රු.27,014,231 ක ප්‍රතිපාදන ඉතිරිවීම නිරීක්ෂණය විය.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑපීඑච්/ඒ/2021/20) | ලැබී තිබෙන අග්‍රිම මුදල් වලින් උපරිම ප්‍රයෝජන ලබාගත යුතුවීම. | පිළිගන්නා බවත් අත් මුදල් ලබාගැනීමට නොහැකි වීම මත වැය විෂයයන්වල ඉතිරිවීම සිදුව තිබෙන බව. |

## 2.2 ආදායම් කළමනාකරණය

(2.2)

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| දෙපාර්තමේන්තුව විසින් ආදායම් ශීර්ෂ 5 ක් යටතේ ඇස්තමේන්තු සකස් කර ආදායම් රැස්කර තිබුණු අතර ආදායම් රැස්කිරීම ඇස්තමේන්තු ගත ආදායමෙන් සියයට 04 සිට සියයට 149 දක්වා පරාසයක පැවතුණි. ඒ අනුව ආදායම් තක්සේරු කිරීම ප්‍රායෝගික, තාත්වික භාවයෙන් තොරව සිදු කර තිබුණි. (සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඒපීඑච්/ඒ/2021/20) | පූර්ව දත්ත පදනම් කරගෙන හැකිතාක් තාත්වික හා නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | පිළිගන්නා බවත් එම වෙනස්කම් ඉදිරියේදී අවම කර ගැනීමට කටයුතු කරන බව. |

## 2.3. වියදම් කළමනාකරණය

(2.3)

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| වැය විෂයයන් 18 ක් සඳහා වෙන්කර තිබුණු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු. 115,682,791 ක් උපයෝජනය නොකර ඉතිරිකර තිබුණු අතර එම ඉතිරිවීම ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 90 දක්වා පරතරයක පැවතුණි. (සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඒපීඑච්/ඒ/2021/20) | තාත්විකව හා නිවැරදිව ඇස්තමේන්තු සකස් කළ යුතු වීම. | පිළිගන්නා බව. |

## 2.4 බැරකම් හා බැඳීම්වලට එළඹීම

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| දෙපාර්තමේන්තු පොත් අනුව වැය විෂයයන් 05 ක 2020 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු බිල්පත් වටිනාකම රු.5,643,357 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල බැඳීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි (සටහන III) එය රු.4,230,771 ක් ලෙස රු.1,412,586 ක් අඩුවෙන් දක්වා තිබුණි.<br><br>(සිඑල්පිඑල්/කේඩී/එච්/ඩීඡ්පීඑච්/ඒ/2021/20) | මූල්‍ය ප්‍රකාශන පිළිබඳව පිළියෙල කළ යුතුවීම. | පිළිගන්නා බවත් ඉදිරියේදී මෙම ගැටළුව අවම කර ගැනීමට කටයුතු කරන බව. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලැසුම් කිරීම

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සිප්පුකුලම හා කරඳගොල්ල සත්ත්ව පාලන විද්‍යාලවල ඩිප්ලෝමා පාඨමාලාව හැදෑරීම සඳහා පසුගිය අධ්‍යයන වර්ෂ 4 කදී අයදුම්පත් 483 සිට 693 දක්වා වූ ප්‍රමාණයක් ලැබී තිබුණද විද්‍යාලවල පාඨමාලා සඳහා සිසුන් 90 සිට 144 දක්වා හෙවත් සියයට 36 සිට සියයට 76 දක්වා අඩු සිසුන් සංඛ්‍යාවක් තෝරාගෙන [illegible] ප්‍රමාණවත් පරිදි සිසුන් ඇතුළත් කිරීමට | දැනට තිබෙන සම්පත් උපරිම භාවිතයට ගැනීමට පියවර ගත යුතුවීම. | පිළිගන්නා බවත් දුෂ්කර හා ජල පහසුව අවම ප්‍රදේශයක පිහිටි සිප්පුකුලම් සත්ත්ව පාලන භූමිය නඩත්තු කිරීම සඳහා ප්‍රමාණවත් මානව සම්පත් හා මූල්‍ය සම්පත් නොමැති කම මෙම භූමිය සංවර්ධනයට බල [illegible] ප්‍රධාන ගැටළුව බව. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

11

| | | | |
|---|---|---|---|
| | අවසානය යොමුකර ගන්නා අවශ්‍යතාවය සඳහා ඩිප්ලෝමාධාරීන් බිහි කිරීමට කටයුතු නොකිරීම නිසා සත්ත්ව පාලන විද්‍යාල සතුව තිබෙන ඉඩම් සහ ගොඩනැගිලි අර්ධ භාවිත තත්ත්වයේ පැවතුණි. සිප්පුකුලම විද්‍යාලයේ පමණක් ඉඩම් අක්කර 129 ක්ද ගොඩනැගිලි වර්ග 21 ක්ද තිබුණු නමුත් ප්‍රමාණවත් ජල පහසුකම් හා මානව සම්පත් නොතිබීම මෙම තත්ත්වයට හේතු වී තිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑපීඑච්/ඒ/2019/42) | | |
| 3.1.1 (ආ) | සත්ත්ව රෝග මර්දන වැඩසටහන යටතේ එන්නත් කරනු ලබන්නේ සමස්ත ගව ගහනය පදනම් කරගෙන නොව රෝග අවදානම් ගහනය පදනම් කරගෙන වුවද, රෝග අවදානම් ප්‍රදේශ හා පළාත් කාර්යාලවලින් ලබාදෙන තොරතුරු පදනම් කරගෙන ඉලක්කයන් සකස් කළද රෝගය මර්ධනය කිරීම සඳහා උපාය මාර්ගික සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑපීඑච්/ඒ/2019/52) | උපායමාර්ගික සැලැස්මක් පිළියෙල කළයුතු වීම. | නීති විරෝධී සුරින් සෞඛ්‍ය සහතික නොමැතිව රාජ්‍ය නොවන ආයතන හා පුනා ආයතන සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ උපදේශකත්වය නොමැතිව හා කිසිදු දැනුම්දීමකින් තොරව රෝගී සතුන් පිං පිණිස බෙදා හැරීම නිසා රෝග ව්‍යාප්තිය වැඩිවන බව. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

12

3.2 කාර්යභාරයන් ඉටු නොකිරීම

(3.1.2)

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| පශු සම්පත් අභිජනන ව්‍යාපෘතිය යටතේ DF සීමන් වඩි 3,500 ක් සහ පචිචි හරක් 20 ක් ආනයනය කිරීමට සැලැසුම් කර තිබුණු නමුත් එම කාර්යයන් ඉටු කර නොතිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/සීඒපීඑච්/බී/2021/02) | සැලැසුම් කළ කාර්යය භාරයන් ඉටු කළයුතු වීම. | DF ගව ශුක්‍ර වඩි ආනයනය කිරීම සඳහා ප්‍රසම්පාදන කටයුතු සිදුකර ටෙන්ඩරය පිරිනමින ලද අතර අදාළ සැපයුම්කරු විසින් ගවශුක්‍ර වඩි මෙතෙක් ලබාදී නොමැති බව හා පචිචි හරක් ගෝලීය වසංගතය හේතුවෙන් ආනයන කිරීම සීමා කිරීම හේතුවෙන් සතුන් ආනයනය කිරීමට නොහැකි වූ බව. |

3.3 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබානොගැනීම

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| 3.1.3 (අ) (අ) | සීමන් වඩි 325000 ක් දේශීයව නිපදවීමට සැලැසුම් කර තිබුණද නිෂ්පාදනය කර තිබුණේ වඩි 218,835 ක් හෙවත් සියයට 67 ක් පමණකි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ඉලක්කයන් ලඟාකර ගැනීමට පියවර ගත යුතුවීම. | පිළිගන්නා බවත් රටතුළ පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සැලැසුම් කළ පරිදි වාර්ෂික භෞතික ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බව. |
| " (ආ) (ආ) | එන්නත් 400000 ක් මිලදී ගැනීමට සැලැසුම් කර තිබු නමුත් මිලදී ගෙන තිබුණේ එන්නත් 225000 ක් හෙවත් සියයට 56 ක් පමණකි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ඉලක්කයන් ලඟාකර ගැනීමට පියවර ගත යුතු වීම. | පිළිගන්නා බවත් රටතුල පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි වාර්ෂික භෞතික ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බව. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

13

| | | | |
|---|---|---|---|
| (ඇ) | කුකුළන් සඳහා කමෙලු මට්ටමේ එන්නත් 5916400 ක් ලබාදීමට සැලසුම් කර තිබුණද එන්නත් 3494271 ක් හෙවත් සියයට 59 ක් පමණක් ලබාදී තිබුණි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ඉලක්කයන් ලඟාකර ගැනීමට පියවර ගත යුතුවීම. | පිළිගන්නා බවත් රටතුළ පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි වාර්ෂික භෞතික ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බව. |
| (ඈ) | සතුන් 140000 ක කන් සලකුණු කිරීමට සැලසුම් කර තිබූ නමුත් සලකුණු කර තිබුණේ සතුන් 81025ක් පමණකි. | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ඉලක්කයන් ලඟාකර ගැනීමට පියවර ගත යුතු වීම. | පිළිගන්නා බවත් රටතුළ පවතින කොරෝනා වසංගත තත්ත්වය හේතුවෙන් සැලසුම් කළ පරිදි වාර්ෂික භෞතික ඉලක්ක සපුරා ගැනීමට නොහැකි වූ බව. |
| (ඉ) | නිෂ්පාදනය කිරීමට සැලසුම් කරන ලද FMD එන්නත්වලින් සියයට 10 ක් පමණක් නිෂ්පාදනය කර තිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑම්එච්/බී/2021/02) | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් ඉලක්කයන් ලඟාකර ගැනීමට පියවර ගත යුතුය. | පිළිගන්නා බවත් එන්නත් නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය 2020 වර්ෂයේදි අපේක්ෂිත ලෙස ලබාගැනීමට නොහැකි වූ බව. |

3.4 ප්‍රසම්පාදනය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | 2020 ඔක්තෝබර් 12 දින අංක 255 දරන වවුචරයෙන් මුඛ හා කුර රෝග සඳහා භාවිතා කරන එන්නත් 100,000 ක් එකක් රු.82 බැගින් මිලදී ගැනීම සඳහා ගෙවා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු අනාවරණය විය. | | |

| | | | |
|---|---|---|---|
| (i) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2 මාර්ගෝපදේශය අනුව ලංසු කැඳවීම සිදුකර තිබුණ ද 2020 මැයි 29 දින පළකරන ලද පුවත් පත් දැන්වීමේ මිලදී ගැනීමට අපේක්ෂා කරන එන්නත් තොග ප්‍රමාණය සඳහන් කර නොතිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ ඩීඒපීඑච්/2021/04) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුවීම. | පිළිගන්නා බව. |
| (ii) | 2020 ජූනි 24 දින ලංසු විවෘත කර තිබුණු අතර එක් සැපයුම් ආයතනයකින් පමණක් එක් වඩියක් රු.82 බැගින් ලංසු ලැබී තිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ ඩීඒපීඑච්/2021/04) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුවීම. | පිළිගන්නා බව. |
| (iii) | තාක්ෂණික ඇගැයීම් කමිටුව 2020 ජූලි 03 දින ලබා දී තිබුණු වාර්තාවේ සැපයුම්කරු අනෙකුත් කොන්දේසි සපුරා තිබෙන නමුත් ඉදිරිපත් කර තිබෙන මිල 2018 සහ 2019 වර්ෂවල සැපයූ මිල ගණන් හා සැසඳීමේ දී පිළිවෙලින් සියයට 136 ක් සහ සියයට 73.51 ක් වැඩි බව දක්වා තිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ ඩීඒපීඑච්/2021/04) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතු වීම. | හදිසි අවශ්‍යතාවයක් ලෙස සලකා මිලදී ගැනීම සිදු කර ඇති බව. |
| (iv) | 2020 වර්ෂයේදී නැවත එන්නත් වඩි 300,000 ක් මිල දී ගැනීම සඳහා 2020 අගෝස්තු 17 දින මිල කැඳවීමේදී එම එන්නත් එක වඩියක් රු.42.05 කට සැපයීමට සැපයුම්කරුවෙකු ඉදිරිපත් වී තිබුණි.<br>සීඑල්පීඑල්/කේඩී/එච්/ ඩීඒපීඑච්/2021/04) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධාන අනුගමනය කළ යුතුවීම. | පිළිගන්නා බව. |

| | | | |
|---|---|---|---|
| (v) | මෙ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.<br>i. ප්‍රසම්පාදන මාර්ගොපදේශ සංග්‍රහයේ 7.12 මාර්ගෝපදේශය සඳහන් පහත දැක්වෙන කරුණු කෙරෙහි අවධානය යොමු කර නොතිබීම.<br>• වලංගු තරඟකාරී බවක් නොමැති බව පැහැදිලිව පෙනෙන විට ඒ අනුව ලැබුණු ලංසු ප්‍රතික්ෂේප කිරීම.<br>• ලැබී තිබුණු ලංසුව වෙළඳපොල මිල ගණන් සමඟ සැසඳීම<br>• ලැබී ඇති එකම මිල අධික නම්. ලංසු මිල අඩු කර ගැනීම සඳහා ලංසු කරු සමඟ සාකච්ඡා කිරීම | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවීම. | පිළිගන්නා බව. |
| | ii. 2018,2017 සහ 2016 යන වර්ෂ වලදී මෙම එන්නත් මිල පිළිවෙලින් රු. 30.30,රු.30.33 සහ රු.32.17 ක් වුවද මෙම මිලදී ගැනීමේදී එම මිල ගණන් සමඟ සසඳා නොතිබීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවීම. | පිළිගන්නා බව. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

16

| | | |
|---|---|---|
| iii. 2020 අගෝස්තු 17 දින මිල කැඳවීමේදී ලැබී තිබුණු රු. 42.05 ලංසුව සමඟ සැසඳීමේදී 2020 ඔක්තෝබර් 12 දින අංක 255 දරන වවුචරයෙන් ඒකක් රු.82 බැගින් ගෙවා මිලදී ගන්නා ලද එන්නත් වඩි 100.000 සඳහා රු.3,995,000 ක් වැඩිපුර ගෙවා තිබීම. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවීම. | පිළිගනිමු බව. |
| (සිඑල්පිඑල්/කේඩී/එච්/ඩීඒපීඑච්/2021/04) | | |
| (ආ) දියර නයිට්‍රජන් 2019 වර්ෂයේදී ලීටර් 261,704 ක් ද 2020 පෙබරවාරි දක්වා ලීටර් 41,404 ක් ද වශයෙන් ලීටර් 303,108 ක් එක ලීටරයකට රු.74 බැගින් රු.22,429,992 ක් ගෙවා මිලදී ගෙන තිබුණු අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය. | . | |
| (i) 2019 වර්ෂයේදී මිල ගණන් කැඳවීමේ දී සැපයුම්කරුවන් දෙදෙනෙකු විසින් රු.62 සහ රු.74 වශයෙන් මිල ගණන් ඉදිරිපත් කර තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.19 (ආ) මාර්ගෝපදේශය අනුව මිල ගණන් ඇගයීමෙන් පසු අවම මිල තෝරා ගත යුතු වුවත් වැඩි මිල තෝරාගෙන ලීටරයක් රු.74 බැගින් දියර නයිට්‍රජන් ලීටර් 261,704 ක් සඳහා රු.19,366,096 ක් ගෙවා තිබුණි.අවම මිල තෝරා ගත්තේ නම් | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවීම. | ටෙන්ඩර් පිරිවිතර සියල්ලටම කොන්දේසි විරහිතව එකඟවී තිබීම හේතුවෙන් වැඩි මිල සහිත සැපයුම්කරු තෝරාගත් බව. |

| | | |
|---|---|---|
| මේ සඳහා වැය වනනේ රු.16,225,648 ක් පමණක් බැවින් රු.3,140,448 ක් ඉතිරි කර ගත හැකිව තිබුණි. | | |
| (ii) තම ආයතනය ඉරිදා සහ වෙළඳ නිවාඩු දිනයන්හි වසා තබන අතර එම දිනයන්හිදී මිලදී ගන්නේ නම් රු.3000 ක අමතර මුදලක් අයකර ගන්නා බවට අවම මිල වූ රු.62 ඉදිරිපත් කල සැපයුම්කරු විසින් කොන්දේසියක් පනවා තිබීම තාක්ෂණික ඇගයීම් කමිටුව විසින් එම සැපයුම්කරු ප්‍රතික්ෂේප කිරීමට ප්‍රධානතම හේතුව වී තිබුණි. ලීටර් එකක් සඳහා රු.62 බැගින් ලීටර් 261,704 ක් රු.16,225,648 ක වටිනාකමකට මිලදී ගැනීමෙන් සහ 2019 වර්ෂයේ ප්‍රසිද්ධ සහ වෙළඳ නිවාඩු දිනයන් 28 පැවති බැවින් එක දිනකට රු.3,000 බැගින් රු.84,000 ක් අතිරේකව ගෙවීමෙන් වුවද වැය වන්නේ රු.16,309,648 ක් පමණකි. එබැවින් අවම මිල ඉදිරිපත් කල සැපයුම්කරුගේ මෙම කොන්දේසිය සටහේ මිල දී ගනු ලැබුයේ වුවද දෙපාර්තමෙන්තුවට රු.3,056,448 ක මුදලක් ඉතිරි කර ගත හැකිව තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවීම. | පිළිගන්නා බව |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

18

| | | |
|---|---|---|
| (iii) අවම මිල සැපයුම්කරු විසින් තමන්ගේ ලංසුව ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවට ද සංවර්ධන උපාය මාර්ග හා ජාත්‍යන්තර වෙළෙඳ අමාත්‍යාංශයේ ලේකම් ට ද පැමිණිලි කර තිබූ අතර ඒ සම්බන්ධයෙන් එම ආයතන විසින් කරන ලද විමසීම් වලට දෙපාර්තමේන්තුව දක්වන ලද ප්‍රතිචාර තහවුරු නොවිය. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවීම. | දෙපාර්තමේන්තුවේ නලධාරීන් දෙදෙනෙකු සහභාගී වී තිබුණද එම රැස්වීම් වාර්තාව දෙපාර්තමේන්තුව වෙත යොමු කර නොමැති බව |
| (iv)2020 වර්ෂය සඳහා දියර නයිට්‍රජන් මිලදී ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු කල්වේලා ඇතිව ආරම්භ නොකිරීම හේතුවෙන් 2019 දෙසැම්බර් මස 21 වන දින රැස්වූ ප්‍රසම්පාදන කමිටුව 2019 වර්ෂයේ මිලදී ගැනීම සඳහා වූ 2018 නොවැම්බර් 15 දිනැති ප්‍රසම්පාදන මණ්ඩල තීරණය 2020 පෙබරවාරි මස දක්වා නැවත ඇණවුම් කිරීමේ ප්‍රසම්පාදන ක්‍රමය යටතේ දීර්ඝ කර තිබුණි. ඒ අනුව 2020 ජනවාරි සහ පෙබරවාරි මාස සඳහා ලීටරයක් රු.74 බැගින් ලීටර් 41,404 ක් සඳහා රු.3,063,896 ක් ගෙවා මිලදී ගෙන තිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවීම. | පිළිගන්නා බව |

| | | |
|---|---|---|
| (V)රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.6 මාර්ගෝපදේශය යටතේ භාණ්ඩ සැපයීම් සඳහා නැවත ඇණවුම් කළ හැක්කේ මුල් සැපයුමෙන් පසු මිල අඩු වී නොතිබුණු බවට අස්ථිත්වය සහතික වන්නේ නම් පමණකි. එහෙත් 2020 වර්ෂයට ලංසු කැඳවීම 2020 ජනවාරි 03 දින සිට සිදු කෙරුණු අතර 2020 ජනවාරි 24 දින ලංසු විවෘත කෙරුණි. එහිදී එක් සැපයුම්කරුවෙකු විසින් දියර නයිට්‍රජන් ලීටර් එකක් රු.60.25 කට සැපයීමට ඉදිරිපත් වී තිබුණි. මේ අනුව නැවත ඇණවුම් කිරීමේ ක්‍රමය යටතේ මිලදී ගත් ලීටර් 41,404 ක් සඳහා දෙපාර්තමේන්තුවට ලීටරයකට රු.13.75 බැගින් රු.569,305 ක මුදලක් අහිමි වී තිබුණි.<br><br>(සීපල්පීඑල්/කේඩී/එච්/ඩීඒපීඑච්/2020/21) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ සඳහන් මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවීම. | පිළිගන්නා බව |

3.5. ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම

3.1.3.2

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| පොල්ගොල්ල සත්ත්ව විෂාණු රසායනාගාරය ඇස්තමේන්තුගත වටිනාකම රු.3,273,873 ක් වූ වැඩ විෂයයන් 95 ක් යටතේ වැඩිදියුණු කිරීම හා අලුත්වැඩියා කිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත් ආයතනයක් සමඟ 2018 අගෝස්තු 31 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර 2018 දෙසැම්බර් 29 දිනට කාර්යයන් නිමකර භාරදිය යුතු ව තිබුණු නමුත් එදින සිට 2020 අගෝස්තු 11 දින වන විට මාස 19 ක් ගතවී ඇතත් වැඩ නිම නොකිරීම නිසා ගිවිසුම අවලංගු කර තිබුණි. වැඩ විෂයයන් 95 න් 10 ක් සම්පූර්ණයෙන්මද 06 ක් අර්ධ වශයෙන්ද නිම කර තිබුණු නමුත් ඇස්තමේන්තුගත වටිනාකම රු.2,262,204 ක් වූ වැඩ විෂයයන් 78 ක කටයුතු ඉටුකර නොතිබුණි.<br><br>(සීඑල්පීඑල්/සෝඩ්/එම්/ඩීඑපීඑච්/බී/2021/06) | ගිවිසුම ප්‍රකාරව කටයුතු කළ යුතුවිම. | ගිවිසුමෙහි සඳහන් දිනට වැඩ නිම කර භාර නොදීම හේතුවෙන් ගිවිසුම අවලංගු කළ බව. |

21

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

5.6 මුදල් නිදහස්කර තිබුණත් ප්‍රගතියක් ලබා නොතිබුණු ව්‍යාපෘති

| | | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|---|
| 2.6 (ආ) | (අ) | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.1.1.(ඇ) මාර්ගෝපදේශය අනුව ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කළ යුත්තේ අවශ්‍ය අරමුදල් ප්‍රතිපාදනය කර ඇති බවට ස්ථිර බැඳීමකින් පසු වුවද එසේ අරමුදල් ප්‍රතිපාදන කර ගැනීමකින් තොරව ඇස්තමේන්තුගත වටිනාකම රු.165,831,215 ක් වූ ගොඩනැගිලි ඉදිකිරීම් 3 කට අදාළ ව්‍යුහාත්මක හා වාස්තු විද්‍යාත්මක සැලැසුම් සකස් කිරීම සඳහා 2018 වර්ෂයේ දී ආයතනයකට රු.1,602,094 ක් ගෙවා තිබුණු නමුත් 2020 දෙසැම්බර් 31 වන විටත් එයින් කිසිදු ඉදිකිරීමක් ආරම්භ කර නොතිබුණි. | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ අනුගමනය කළ යුතුවීම හා ප්‍රතිපාදන ඵලදායිව උපයෝජනය කළයුතු වීම. | පිළිගන්නා බව. |
| 3.1.4 | (ආ) | ත්‍රිකුණාමලය පශු වෛද්‍ය කාර්යාලය ඉදිකිරීම සඳහා තෝරාගත් කොන්ත්‍රාත්කරුවෙකු සමග 2016 අගෝස්තු 09 දින ගිවිසුමකට එළඹ තිබුණු අතර ගිවිසුම අනුව රු.12,182,590 ක මුදලකට 2016 දෙසැම්බර් 07 දින වැඩ නිමකර භාරදිය යුතුව තිබුණි. කොන්ත්‍රාත්කරු විසින් කරන ලද ඉල්ලීම පිළිගෙන අවස්ථා 03 කදී 2018 මාර්තු 31 දින දක්වා කාලය දීර්ඝ කර තිබුණු නමුත් එදිනවිද ඉටුකර තිබුණේ සැලැසුම් ගත කාර්යයන්වලින් අර්ධයක් පමණක් රු.6,996,885 ක වැඩ ප්‍රමාණයක් බැවින් 2018 | ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘති ඉටු කර ගැනීමට කටයුතු කළයුතු වීම. | නියමිත කාලයට වඩා අවුරුදු 01 මාස 05 ක කාලයක් ලබාදී තිබුණද එම කාලය තුලදීද මෙම කාර්යය ඉටු කිරීමට කොන්ත්‍රාත්කරු අපොහොසත් වීම හේතුවෙන් මෙම කොන්ත්‍රාත්තුව අවලංගු කළ බව. |

ජූනි 18 දින ගිවිසුම අවසන් කර තෝරාගත් නව කොන්ත්‍රාත්කරුවෙකුට කාර්යය පවරා තිබුණි.

(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑපීඑච්/බී/2020/17)

## 3.7 වාර්ෂික කාර්යසාධන වාර්තාව

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 2/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව රාජ්‍ය මුදල් දෙපාර්තමේන්තුව විසින් නිකුත් කළ මාර්ගෝපදේශ අංක 14 හි සඳහන් පරිදි වාර්ෂික කාර්යසාධන වාර්තාව පිළියෙළ කළ යුතුව තිබුණි. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(2) වගන්තිය අනුව කාර්යය සාධන වාර්තාව වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සමග විගණනය සඳහා ඉදිරිපත් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | චක්‍රලේඛ උපදෙස් හා ව්‍යවස්ථාපිත විධිවිධාන අනුව කටයුතු කළයුතු වීම. | පිළිගන්නා බවත් ඉදිරියේදී විගණනයට ඉදිරිපත් කරන බව. |

3.8 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | සිප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලය සතු රජයේ නිවාස 04 ක් සංචාරක නිවාසයක් ඇතුළු ගොඩනැගිලි 09 ක් භාවිතයෙන් තොරව නිෂ්කාර්යයව පැවතුණි. මෙයින් ගොඩනැගිලි 05 ක් අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවති අතර 04 ක් කාර්යය මණ්ඩල පුරප්පාඩු නිසා භාවිතයෙන් තොරව පැවතුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීජිපීඑච්/2019/42) | වත්කම් ඵලදායි ලෙස උපයෝජනය කළයුතු විම. | සියළු ගොඩනැගිලි අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට නියමිත බව |
| (ආ) | සිප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයේ ප්‍රයෝජනය සඳහා රු.1,553,000 ක් වැය කර අලුත්වැඩියා කරන ලද බීජ රක්ෂිතාගාරය යන්ත්‍රය ක්‍රියාවිරහිත වීම හේතුවෙන් වසර 03 ක් පමණ කාලයක සිට භාවිතයෙන් තොරව නිෂ්කාර්යව පැවතුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීජිපීඑච්/2019/42) | පවතින සම්පත් උපරිම ලෙස භාවිතයට ගැනීමට පියවර ගත යුතුවීම. | මෙහි සවිකර ඇති යන්ත්‍රයක පවතින කාර්මික දෝෂය නිවැරදි කොට සිසුන්ගේ පුහුණු අවශ්‍යතාවයන් යෙදෙන අවස්ථාව වන විට මෙම බීජ රක්ෂිතාගාරය භාවිතයට ගැනීමට නියමිත බව . |
| (ඇ) | සිප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලයෙන් සත්ත්ව පාලන අධ්‍යාපන කටයුතු වෙනුවෙන් උපයෝගි කරගන්නා සතුන් 357 ක් රඳවා සිටින අතර 2019 වර්ෂය තුලදී සතුන්ගේ ආහාර අවශ්‍යතාවය වෙනුවෙන් රු.1,965,700 ක් වැය කර තිබුණද 2019 වර්ෂය තුල කිසිදු අධ්‍යයන කටයුත්තක් සිදු කර නොතිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීජිපීඑච්/2019/42) | පවතින සම්පත් උපරිම භාවිතයට ගැනීමට පියවර ගත යුතුය. | පාඨමාලා නවීකරණය කිරීමේ අවශ්‍යතාවය මත හා රටේ පවතින වසංගත තත්ත්වය මත රජයේ බලධාරීන් ගෙන ඇති තීරණ අනුව සත්ත්ව පාලන ඩිප්ලෝමා පාඨමාලාව පැවැත්වීම අත්හිටවූවද පුහුණු මධ්‍යස්ථානයක් ලෙස ක්‍රියාකර ඇති බව . |

| | | | |
|---|---|---|---|
| (iv) (ඈ) | සිප්පුකුලම සත්ත්ව පාලන විද්‍යාලය පිහිටි අක්කර 129 ක ඉඩම 1985 වසරේ සිට භාවිතා කරන නමුත් 2020 වර්ෂය වන විටත් දෙපාර්තමේන්තුවට පවරාගෙන නොතිබුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ ඩීඒපීඑච්/2019/42) | විධිමත්ව පවරා ගැනීමට කටයුතු කළ යුතු වීම. | ඉඩම්වල පවරා ගැනීමේ කටයුතු මේ වන විටද සිදු වෙමින් පවතින බව. |
| 3.2.2 (i) (ඉ) | කරදගොල්ල කුකුල් පර්යේෂණ මධ්‍යස්ථානය පිහිටි ඉඩම අක්කර 25 ක් වන නමුත් එයින් අක්කර 06 ක පමණ භූමියක් නිසි භාවිතයෙන් තොරව පැවතුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ ඩීඒපීඑච්/2020/08) | පර්යේෂණ මධ්‍යස්ථානය සතු වත්කම්වලින් උපරිම ප්‍රයෝජන අත්කර දීමට පියවර ගත යුතු වීම. | පිළිගන්නා බව. |
| (ii) (ඊ) | 2015 වර්ෂයේ එවකට පැවති තාරා කොටුව රු.1,562,000 ක් වැය කර ගව ගාලක් බවට පරිවර්තනය කර තිබුණු නමුත් එය 2020 ඔක්තෝබර් වන විටත් භාවිතයෙන් තොරව පැවතුණි.<br><br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ ඩීඒපීඑච්/2020/08) | පර්යේෂණ මධ්‍යස්ථානය සතු වත්කම්වලින් උපරිම ප්‍රයෝජනය අත්කර දීමට පියවර ගත යුතුවීම. | පුහුණු ශ්‍රමිකයන් නොමැතිව අභිජනන ගොවිපළක් පවත්වා ගෙන යා නොහැකි අතර ශ්‍රමික අවශ්‍යතාවය ලද විගස මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන බව. |

## 3.9 පාඩු හා හානි

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන් දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| සමාලෝචිත වර්ෂය තුළ දී සිද්ධි 371 කට අදාළ රු.2,742,375 ක පාඩු හා හානි පොත්වලින් කපාහැර තිබුණි. එයින් රු.2,172,000 කට අදාළ සිද්ධි 31 රු.25,000 ට වැඩි වටිනාකම් සහිත අලාභ විය. (සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑම්එච්/ඒ/2021/20) | පාඩු හා හානි අවමකර ගැනීමට පියවර ගත යුතුවීම. | පිළිගන්නා බව. |

## 3.10 විගණන විමසුම්වලට පිළිතුරු ලබානොදීම

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | දෙපාර්තමේන්තුවේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (ii) | විගණකාධිපතිවරයාට අවශ්‍යවන පරිදි නිශ්චිත කාල සීමාවන් තුළ සියළුම විගණන විමසුම්වලට පිළිතුරු සැපයීම සිදුවන බවට ගණන්දීමේ නිලධාරි සහතික විය යුතු වුවත් වාර්තාවේ 3.10 ඡේදය ප්‍රකාරව විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නොතිබුණි. පහත සඳහන් විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී නොතිබුණි.<br><br>විමසුම් අංකය — නිකුත් කළ දිනය<br>සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑම්එච්/2020/06 — 2020.09.30<br>සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑම්එච්/2020/08 — 2021.01.15<br>(සීඑල්පීඑල්/කේඩී/එච්/ඩීඑම්එච්/ඒ/2021/20) | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුවීම. | ඉදිරියේදී ප්‍රමාදයකින් තොරව පිළිතුරු සැපයීමට කටයුතු කරන බව. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

26

.11 කළමනාකරණ දුර්වලතා

සත්ත්ව සෞඛ්‍ය අංශයට අයත් ගබඩාව 2020 ඔක්තෝබර් මස පරීක්ෂාවේදී පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | වර්ග 82 කට අයත් භාණ්ඩ ඒකක 984 ක් මිලදී ගත් දින සිට වසර 02 කට වැඩි කාලයක් ගබඩාවෙන් නිකුත් නොවී පැවතුණි. මෙම ගබඩා භාණ්ඩ අතර රසායනාගාර උපකරණ වර්ග 21 ක් රසායන වර්ග 47 ක් සහ පාරිභෝජ්‍ය භාණ්ඩ වර්ග 14 ක් පැවතුණි. | අවශ්‍යතාවය පදනම් කරගෙන වඩා තාත්ත්වික ලෙස ප්‍රසම්පාදන සැලසුම් සකස් කළ යුතු විම. | රසායන ද්‍රව්‍ය අවසන් වී නැවත මිලදී ගැනීමට නැවත කාලයක් ගතවන බැවින් එම පොරොත්තු කාලය තුළ අදාල පරීක්ෂණ සිදුකර ගෙන යාමේ ගැටළු මතුවන බැවින් අතිරික්ත තොග පවත්වා ගෙන යනු ලබන බව. |
| (ආ) | වර්ග 10 කට අයත් ගබඩා භාණ්ඩ ඒකක 72 ක් ගබඩාවට ලැබුණ දින සිට 2020 ඔක්තොබර් වන විට වසර 5 ක් ගත වී තිබුණු නමුත් ගබඩාවෙන් නිකුත් වී නොතිබුණි. | අවශ්‍යතාවය පදනම් කරගෙන වඩා තාත්ත්වික ලෙස ප්‍රසම්පාදන සැලසුම් සකස් කළ යුතු විම. | පශු විමර්ශන මධ්‍යස්ථාන සඳහා අවශ්‍ය භාණ්ඩ හා ද්‍රව්‍ය අවසන් වී නැවත ලබාගැනීමේදී ප්‍රසම්පාදන ක්‍රියාවලිය සඳහා කාලයක් ගතවන බැවින් එම කාලය තුළ අදාල පරීක්ෂණ කටයුතු සිදු කරගෙන යාමේ ගැටළු මතුවන බැවින් අතිරික්ත තොග පවත්වාගෙන යනු ලබන බව. |
| (ඇ) | වර්ග 24 කට අයත් ගබඩා භාණ්ඩ ඒකක 5,872 ක් කල් ඉකුත් වී තිබුණි.මෙයින් 1,214ක් එන්නත් යාර විය. | අවශ්‍යතාවය පදනම් කරගෙන වඩා තාත්ත්වික ලෙස ප්‍රසම්පාදන සැලසුම් සකස් කළ යුතුවිම. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම ද්‍රව්‍ය භාවිතයට ගත නොහැකි වූ බව. |
| (ඈ) | 2020 ඔක්තෝබර් වන විට භාණ්ඩ මිලදී ගෙන වසරකට අධික කාලයක් ගත වී තිබුණද වර්ග 24 කට අයත් භාණ්ඩ ඒකක 2,462 කින් කිසිවක් ගබඩාවෙන් නිකුත් කර නොතිබුණි. | අවශ්‍යතාවය පදනම් කරගෙන වඩා තාත්ත්වික ලෙස ප්‍රසම්පාදන සැලසුම් සකස් කළ යුතු විම. | කොවිඩ් වසංගත තත්ත්වය හේතුවෙන් මෙම ද්‍රව්‍ය භාවිතයට ගත නොහැකි වූ බව. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

27

(4.) තිරසර සංවර්ධන අරමුණු ළඟාකර ගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | දෙපාර්තමේන්තුව තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර 2030 ''න්‍යාය පත්‍රය'' පිළිබඳ ව දැනුවත් වී සිටියද එහි කාර්යයන්ට සම්බන්ධ තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සංඛ්‍යාත්මකයන් ද ඉලක්ක මත ළඟා වීම් මැන බැලීම සඳහා වන දර්ශකයන් ද හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන් පිළිබඳ දැනුවත් වී එම අරමුණු ළඟාකර ගැනීමට සැලසුම් කළ යුතු වීම. | පසුගිය වසරේ රජයේ තිරසර සංවර්ධන අරමුණු වලට හා ඉලක්කයන්ට අනුව දෙපාර්තමේන්තුව විසින් දර්ශකයන් හඳුනාගැනීමට කටයුතු කර ඇති අතර ඒ අනුව පිළියෙල කරන ලද වාර්තාවේ පිටපතක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. |
| (ආ) | තිරසර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දෙපාර්තමේන්තුවේ කාර්යභාර්ය සම්බන්ධව උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනා ගැනීමට කටයුතු නොකිරීම හේතුවෙන් ආයතනයට අදාළ ඉලක්ක පිළියෙළ කිරීමේදී සහභාගිත්ව ප්‍රවේශයක් නිරූපණය නොකෙරුණි. | තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන් පිළිබඳ දැනුවත් වී එම අරමුණු ළඟාකර ගැනීමට සැලසුම් කළ යුතුවීම. | පසුගිය වසරේ රජයේ තිරසර සංවර්ධන අරමුණුවලට හා ඉලක්කයන්ට අනුව දෙපාර්තමේන්තුව විසින් දර්ශකයන් හඳුනාගැනීමට කටයුතු කර ඇති අතර ඒ අනුව පිළියෙල කරන ලද වාර්තාවේ පිටපතක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

28

| | | |
|---|---|---|
| (ආ) ආයතනයක කාර්යයක නිවැරදි කාර්යසාධන දත්ත පදනමක් පැවතීම අත්‍යාවශ්‍ය වුවත් ආයතනය විසින් තිරසර සංවර්ධන ඉලක්කයන්හි ළඟා වීම මැන බැලීම සඳහා නිවැරදි දත්ත පදනමක් බිහි කර ගැනීමට කටයුතු කර නොතිබුණි. | තිරසර සංවර්ධන අරමුණු සහ ඉලක්කයන් පිළිබඳ දැනුවත් වී එම අරමුණු ළඟාකර ගැනීමට සැලසුම් කළ යුතුවීම. | ඉදිරි වසරේ පටන් තිරසර සංවර්ධන අරමුණුවලට හා ඉලක්කයන්ට අනුව දෙපාර්තමේන්තුව විසින් දර්ශකයන් හඳුනාගැනීමට කටයුතු කර ඇති අතර ඒ අනුව පිළියෙල කරන ලද වාර්තාවේ පිටපතක් ඉදිරියේදී ඉදිරිපත් කිරීමට කටයුතු කරන බව. |

5. යහපාලනය

අභ්‍යන්තර විගණනය

5.1

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (4) වගන්තිය අනුව අභ්‍යන්තර විගණන අංශය විසින් ඉදිරිපත් කරනු ලබන සියලු වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු අතර මුදල් රෙගුලාසි 134 (3) අනුව එම වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. එහෙත් දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන අංශය විසින් 2019 සහ 2020 වර්ෂයන් තුළ නිකුත් කළ විගණන වාර්තා සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | විගණන පනත සහ මුදල් රෙගුලාසි අනුව කටයුතු කළ යුතුවීම. | පිළිගන්නා බවත් 2021 අප්‍රේල් 05 දින 2019 සහ 2020 වර්ෂයන්හි විගණන විමසුම් ඉදිරිපත් කර ඇති බව. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) (i) | දෙපාර්තමේන්තුවේ ජොෂ්ඨ කළමනාකරණ මට්ටම තුළ තනතුරු 22 ක පුරප්පාඩු 63 ක් පැවති අතර එම පුරප්පාඩු අතර අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරු 4 ක්ද, ප්‍රධාන විද්‍යාඥ තනතුරු 6 ක්ද, පශු විමර්ශන නිලධාරි තනතුරු 13 ක්ද විය. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පදනම් කරගෙන පුරප්පාඩු පිරවීමට කටයුතු කළයුතු වීම. | පුරප්පාඩු පිරවීමට අවශ්‍ය කටයුතු සිදු කිරීම සඳහා අමාත්‍යාංශය වෙත දන්වා ඇති බව. |
| (ii) | දෙපාර්තමේන්තුව සඳහා අනුමත කර තිබුණේ පශු වෛද්‍ය නිලධාරි තනතුරු 61 ක් පමණක් වුවද 70 ක් අනුයුක්ත කර තිබූ බැවින් පශු වෛද්‍යවරු 9 ක් අතිරික්තව පැවතුණි. | අනුමත කාර්යය මණ්ඩලය තුළ කටයුතු කළයුතු වීම. | පශු වෛද්‍ය නිලධාරීන් 07 ක් සඳහා සත්ත්ව නිරෝධායන නිලධාරි තනතුරු නාමයද පශු වෛද්‍ය නිලධාරීන් 10 ක් සඳහා පශු වෛද්‍ය නිලධාරි නාමයද ලබාදීමට ඉදිරි කටයුතු සිදුකරමින් පවතින බව. |
| (iii) | දෙපාර්තමේන්තුව සඳහා සංඛ්‍යා ලේඛනඥ තනතුරක් අනුමත කර නොමැති නමුත් එක් නිලධාරියෙකු අනුයුක්ත කර තිබුණි. | අනුමත කාර්යය මණ්ඩලය තුළ කටයුතු කළයුතු වීම. | එම තනතුර දෙපාර්තමේන්තුව වෙත අනුමත කර ගැනීම සඳහා ඉදිරි කටයුතු සිදු කරමින් පවතින බව. |

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | | |
|---|---|---|---|
| (iv) | ප්‍රාථමික රෝහලේ පුරප්පාඩු 103 ක් පැවති බැවින් ක්ෂේත්‍ර කාර්යයන් කරගෙන යාමේදී අපහසුතා පැන නැගී තිබුණි. | දෙපාර්තමේන්තුවේ අවශ්‍යතාවය පදනම් කරගෙන පුරප්පාඩු පිරවිය යුතු බව. | කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 01/2020 අනුව සියළුම බඳවා ගැනීම් නැවත දැනුම් දෙන තුරු අත්හිටුවා ඇති බව. |
| (ආ) | 2013 අප්‍රේල් 05 දිනැති අංක PSC/EST/3/4/2/2012 දරන රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ ලිපියෙන් අනුමත කර තිබුණු ප්‍රාථමික ශිල්පීය නොවන සේවක ගණයේ ස්ථාන මාරු පටිපාටිය අනුව වසර 5 කට වැඩි කාලයක් එකම සේවා ස්ථානයක සේවය කර ඇති සේවකයින් ස්ථාන මාරු කිරීමට අනිවාර්යයෙන්ම යටත් විය යුතු වුවද වසර 11 සිට වසර 30 දක්වා එකම ස්ථානයේ සේවයකළ සේවකයන් 16 ක් සම්බන්ධයෙන් එම අවශ්‍යතාවය ඉටුකර නොතිබුණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්යය පටිපාටිය අනුගමනය කළ යුතු වීම.. | ඉදිරියේදී ස්ථාන මාරුවීම ලබාගැනීමට කටයුතු කරන බව. |

**ජාතික විගණන කාර්යාලය**
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE
NAOSL

| | | | |
|---|---|---|---|
| (ඈ) | රාජ්‍ය අංශය තුළ මානව සම්පත් සංවර්ධනයට අදාළ 2018 ජනවාරි 24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ සඳහන් පරිදි කාර්යසාධන ඇගයීම් පත්‍රිකා භාවිතය, කාර්යසාධන ගිවිසුම් අත්සන් කිරීම, මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කිරීම සහ වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සඳහා කාර්ය මණ්ඩලය යොදවාගන්නා ආකාරය පිළිබඳ සැලැස්මක් සකස් කිරීම යන අවශ්‍යතා කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි. | චක්‍රලේඛය කෙරෙහි අවධානය යොමු කළ යුතුය. | අංශ මට්ටමින් සැලැස්මක් සකස් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. |

එම්.එස්. නයනකුමාර
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

M. S. Nayanakumara
Assistant Auditor General
National Audit Office

පිටපත්:-

1. මුදල් විෂයභාර අමාත්‍ය - මුදල් අමාත්‍යාංශය
2. විෂයභාර අමාත්‍ය - පශු සම්පත් , ගොවිපළ ප්‍රවර්ධන, කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය

## 4. කාර්යසාධන දර්ශක

### 4.1. ආයතනයේ කාර්යසාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

| අනු අංකය | විශේෂිත දර්ශක | අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක් (%) ලෙස තත්‍ය නිමැවුම | | |
|---|---|---|---|---|
| | | 100%-90% | 75%-89% | 50%-74% |
| 1 | දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන/වසරකට) | ✓ | | |
| 2 | වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර ගණන/වසරකට) | ✓ | | |
| 3 | වාර්ෂික ඒකපුද්ගල කුකුළු මස් පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (කි.ග්‍රෑම් වසරකට) | ✓ | | |
| 4 | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය වැඩිවීමේ ප්‍රමාණය | | | ✓ |

* අදාල ව්‍යාපෘතිවල ප්‍රතිලාභීන්ගේ නියැදියන්ගෙන් ලබාගත් තොරතුරු මත මෙම ගණනය කර ඇත

## 5. තිරසාර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්යසාධනය

### 5.1. හඳුනාගන්නා ලද අදාළ තිරසාර සංවර්ධන අරමුණු

| ඉලක්කය/අරමුණු | ඉලක්ක | ජයග්‍රහණ දර්ශක | මේ දක්වා ජයග්‍රහණ ලබා ගැනීමේ ප්‍රගතිය | | |
|---|---|---|---|---|---|
| | | | 0%-49 | 50%-74% | 75%-100% |
| (I) සියලු තැන්හි පවතින සෑම ආකාරයකම දුගීබව අවසන් කිරිම | වසර 2021 වන විට දේශිය කිරි නිෂ්පාදනය ලීටර මිලියන 493 දක්වා ඉහල නැංවීම | දේශීය කිරි නිෂ්පාදනය වැඩිවීමේ ප්‍රමාණය (ලීටර් මිලියන/වසරකට) | | | ✓ |
| (II) සාගින්න නැතිකර ආහාර සුරක්ෂිතතාවය හා යහපත් පෝෂණ තත්වයන් දිනාගෙන තිරසර කෘෂිකර්මාන්තය ප්‍රවර්ධනය කිරීම | වසර 2021 වන විට වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය 130 දක්වා ඉහල නැංවීම | වාර්ෂික ඒකපුද්ගල බිත්තර පරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (බිත්තර ගණන/වසරකට) | | | ✓ |
| | වසර 2021 වන විට වාර්ෂික ඒකපුද්ගල කුකුල් මස් පරිභෝජනය කිලෝ ග්‍රෑම් 10 දක්වා ඉහල නැංවීම | වාර්ෂික ඒකපුද්ගල කුකුල් මස් පාරිභෝජනය වැඩිවීමේ ප්‍රමාණය (කුකුල් මස් කිලෝ ග්‍රෑම් /වසරකට) | | | ✓ |
| (III) ආර්ථික වර්ධන වේගය ඉහළ නැංවීම | කෘෂිකර්ම කේෂ්ත්‍රය තුළ සත්ත්ව නිෂ්පාදන අංශයේ වර්ධන වේගය 5% දක්වා ඉහළ නැංවීම. | දළ දේශීය නිෂ්පාදිතයේ වර්ධන වේගය 1%-1.5% කින් වැඩිවීමේ ප්‍රමාණය | | ✓ | |

### 5.2. තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන අවශ්‍ය ප්‍රමාණයට ක්‍රමානුකූලව නොලැබීම සහ අවශ්‍ය කාර්ය මණ්ඩල හිඟකම  නිසා තිරසාර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේදී බාධා මතුවේ.

## 6. මානව සම්පත් පැතිකඩ

### 6.1. සේවක සංඛ්‍යා කළමනාකරණය

| | අනුමත සේවක සංඛ්‍යාව | පවතින සේවක සංඛ්‍යාව | ඇබෑර්තු |
|---|---|---|---|
| ජ්‍යෙෂ්ඨ | 195 | 138 | **57** |
| තෘතීයික | 22 | 16 | **06** |
| ද්විතීක | 340 | 296 | **44** |
| ප්‍රාථමික | 395 | 292 | **103** |

### 6.2. ආයතනයේ කාර්යසාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තය බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකාවේ පශු සම්පත් සංවර්ධනය පිළිබඳව වගකීම දරණ ප්‍රධාන රජයේ ආයතනයක් වේ. වර්තමානයේ මෙම දෙපාර්තමේන්තුව පශු සම්පත් ගොවිපොළ ප්‍රවර්ධන සහ කිරි හා බිත්තර ආශ්‍රිත කර්මාන්ත රාජ්‍ය අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වේ.

මෙම දෙපාර්තමේන්තුව රට තුළ සත්ත්ව රෝග පැතිරීම වළක්වාලීම, මැඩපැවැත්වීම, පශු සම්පත් ක්ෂේත්‍රයට අදාළ පර්යේෂණ හා සංවර්ධන කටයුතු, තාක්ෂණික නායකත්වය සැපයීම සහ සත්ත්ව අභිජනන කටයුතු සඳහා විශේෂඥ උපදෙස් හා සහාය සේවාවන් සැපයීම සම්බන්ධව නීත්‍යානුකූල බලය පැවරී ඇති ජාතික ආයතනයද වේ. මුළු දිවයිනම ආවරණය වන පරිදි සිදුකරනු ලබන වෙනත් ප්‍රධාන කටයුතු අතර සත්ත්ව පාලනය පිළිබඳ පුහුණුකරුවන් පුහුණු කිරීම, එම කර්මාන්තය නගාසිටුවීමට අදාළ ව්‍යාපෘති සැකසීම, ආර්ථික ඇගයීම් සහ විශේෂ සංවර්ධන වැඩසටහන්ද ඇතුළත්වේ. පශු සම්පත් ක්ෂේත්‍රයේ සංවර්ධනයට පහසුකම් සැලසීම සඳහා මෙම දෙපාර්තමේන්තුව විසින් අදාළ නීති සම්පාදනය කර ක්‍රියාත්මක කරනු ලැබේ. පළාත් සභා පිහිටුවීමත් සමඟ සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ක්ෂේත්‍ර මට්ටමේ කටයුතු පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු නවය (09) වෙතට පැවරී ඇත.

පශු වෛද්‍ය නිලධාරීන් විසින් මෙහෙයවනු ලබන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල, සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන ක්‍රියාකාරී ඒකකයන්ය. පළාත් සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තු යටතේ ක්‍රියාත්මක වන දිවයිනේ සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකම පාහේ පිහිටුවා තිබෙන ප්‍රාදේශීය පශු වෛද්‍ය කාර්යාල 337 මගින් බිම් මට්ටමේ සිට සියළුම පශු සම්පත් සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

නිරෝගිමත් සත්ත්ව ගහණයක් හා වැඩි නිෂ්පාදන ඵලදායතාවයකින් යුතු ආහාර නිෂ්පාදනය හා ආහාරයන්හි සෞඛ්‍ය ආරක්ෂිතභාවය තහවුරු කිරීම් ආදී පශු සම්පත් ක්ෂේත්‍රයේ තිරසාර සංවර්ධනයක් ලබා දීම උදෙසා තාක්ෂණික මඟ පෙන්වීම හා සහාය ලබා දීමේදී අදාල කාර්යභාරයන් මැනවින් ඉටු කිරිමට අවශ්‍ය කාර්ය මණ්ඩල හිඟකම නිසා ආයතනික ඉලක්ක හා අරමුණු ලගා කර ගැනීමේදී බාධා මතුවේ.

## 6.3. මානව සම්පත් සංවර්ධනය

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු,000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| Regional training seminar for OIE national focal points for veterinary products | 1 | දින 02 | | | විදේශීය | පුද්ගල හැකියා වර්ධනය තුළින් ආයතනයේ සමස්ථ කාර්ය සාධනය වැඩි වේ. |
| UKRI GCRF One health poultry hub project meeting | 1 | දින 08 | | | විදේශීය | එම |
| Better Training for Safer Food (BTSF) regional training workshop on antimicrobial resistance in India | 1 | දින 04 | | | විදේශීය | එම |
| සාමාන්‍ය පරිපාලන හා මූල්‍ය රෙගුලාසි - දෙමළ මාධ්‍ය | 11 | දින 02 | 33,762.00 | | දේශීය | සාමාන්‍ය පරිපාලන හා මූල්‍ය රෙගුලාසි |
| සාමාන්‍ය පරිපාලන හා මූල්‍ය රෙගුලාසි - සිංහල මාධ්‍ය | 53 | දින 02 | 101,331.00 | | දේශීය | සාමාන්‍ය පරිපාලන හා මූල්‍ය රෙගුලාසි |
| රාජ්‍ය හා ආයතනික කළමනාකරණය | 80 | දින 02 | 150,198.00 | | දේශීය | රාජ්‍ය හා ආයතනික කළමනාකරණය |
| ව්‍යාපෘති යෝජනා ලිවීම | 22 | දින 01 | 2,700.00 | | දේශීය | ව්‍යාපෘති යෝජනා ලිවීම |
| ව්‍යාප්තිය සහ සන්නිවේදනය | 40 | දින 02 | 84,086.00 | | දේශීය | ව්‍යාප්තිය සහ සන්නිවේදනය |
| ගව හා මී එළ දෙනුන්ගේ සරුබව පිළිබඳ විමර්ශනය | 44 | දින 02 | 97,758.00 | | දේශීය | ගව හා මී එළ දෙනුන්ගේ සරුබව පිළිබඳ විමර්ශනය |
| පශු අණ පනත් හා නීති | 46 | දින 04 | 6,691.00 | | දේශීය | පශු අණ පනත් හා නීති |
| කුර හා මුඛ රෝගය, ගව රක්තාශ්‍රව, කාල ගාත්‍ර රෝග පාලනය | 24 | දින 01 | 29,976.00 | | දේශීය | කුර හා මුඛ රෝගය, ගව රක්තාශ්‍රව, කාල ගාත්‍ර රෝග පාලනය |
| රාජ්‍ය හා ආයතනික කළමනාකරණය | 65 | දින 02 | 142,624.00 | | දේශීය | රාජ්‍ය හා ආයතනික කළමනාකරණය |
| ලංසු ඇගයීම | 56 | දින 01 | 36,710.00 | | දේශීය | ලංසු ඇගයීම |
| නවීන කුකුළු කළමණාකරණ පිළිවෙත් | 91 | දින 02 | 197,232.00 | | දේශීය | නවීන කුකුළු කළමණාකරණ පිළිවෙත් |
| පශු සම්පත් ව්‍යාපෘති සැලසුම් කිරීම සහ යෝජනා ලිවීම | 56 | දින 02 | 148,756.00 | | දේශීය | පශු සම්පත් ව්‍යාපෘති සැලසුම් කිරීම සහ යෝජනා ලිවීම |
| ආහාර සුරක්ෂිතතාවය(Online training) | 20 | දින 02 | 13,306.00 | | දේශීය | ආහාර සුරක්ෂිතතාවය |
| සාමාන්‍ය පරිපාලන හා මූල්‍ය රෙගුලාසි (Online training) | 25 | දින 02 | 252,666.00 | | දේශීය | සාමාන්‍ය පරිපාලන හා මූල්‍ය රෙගුලාසි |
| ක්ෂුද්‍රජීවී ප්‍රතිරෝධය වැළැක්වීම සහ පාලනය කිරීම (Online training) | 25 | දින 01 | 5,206.00 | | දේශීය | ක්ෂුද්‍රජීවී ප්‍රතිරෝධය වැළැක්වීම සහ පාලනය කිරීම |
| ආයතන කළමනාකරණය | 18 | දින 02 | 17,459.00 | | දේශීය | ආයතන කළමනාකරණය |
| රජයේ සේවකයාගේ සාමාන්‍ය හැසිරීම සහ විනය (Online training) | 25 | දින 01 | 19,400.00 | | දේශීය | රජයේ සේවකයාගේ සාමාන්‍ය හැසිරීම සහ විනය |
| පශු වෛද්‍යවරුන්ගේ සීමාවාසික වැඩසටහන | 63 | දින 01 | 29,488.00 | | දේශීය | සීමාවාසික පුහුණුව |
| ආයතන කළමනාකරණය | 30 | දින 02 | 45,599.00 | | දේශීය | ආයතන කළමනාකරණය |

| වැඩසටහනේ නම | පුහුණු කරන ලද සේවක සංඛ්‍යාව | වැඩසටහනේ කාල සීමාව | සමස්ත ආයෝජනය (රු,000) | | වැඩසටහනේ ස්වභාවය (දේශීය/ විදේශීය) | නිමවුම/ ලබාගත් දැනුම |
|---|---|---|---|---|---|---|
| | | | දේශීය | විදේශීය | | |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | 49 | දින 01 | 30,988.00 | | දේශීය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය |
| සනීපාරක්ෂක කිරි නිෂ්පාදනය සහ කිරි පරීක්ෂාව | 09 | දින 01 | 21,242.00 | | දේශීය | සනීපාරක්ෂක කිරි නිෂ්පාදනය සහ කිරි පරීක්ෂාව |
| MS Power Point | 10 | දින 02 | 12,540.00 | | දේශීය | Powerpoint Presentation නිර්මාණය |
| සනීපාරක්ෂක කිරි නිෂ්පාදනය සහ කිරි පරීක්ෂාව | 08 | දින 01 | 22,730.00 | | දේශීය | සනීපාරක්ෂක කිරි නිෂ්පාදනය සහ කිරි පරීක්ෂාව |
| එළු සහ බැටළු පාලනය | 36 | දින 02 | 56,970.00 | | දේශීය | එළු සහ බැටළු පාලනය |
| වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය පිළිබඳ පුහුණු වැඩසටහන | 42 | දින 01 | 45,599.00 | | දේශීය | වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය |
| MS Excel | 11 | දින 02 | 30,988.00 | | දේශීය | MS Excel (දත්ත මෙහෙයවීම) |
| MS Excel | 11 | දින 02 | 21,242.00 | | දේශීය | MS Excel (දත්ත මෙහෙයවීම) |
| MS Excel Follow up | 08 | දින 01 | 12,540.00 | | දේශීය | MS Excel (දත්ත මෙහෙයවීම) |
| MS Word/ MS Power Point | 11 | දින 02 | 21,705.00 | | දේශීය | Mail merge, Powerpoint Presentation නිර්මාණය |
| MS Excel | 12 | දින 02 | 25,048.00 | | දේශීය | MS Excel (දත්ත මෙහෙයවීම) |
| නව මාර්ග නීති, දඩ සහ ප්‍රවාහන නියෝග | 49 | දින 01 | 33,256.00 | | දේශීය | නව මාර්ග නීති, දඩ සහ ප්‍රවාහන නියෝග |
| කාර්යාල උපකරණ (ඡායා පිටපත් යන්ත්‍රය, ෆැක්ස් යන්ත්‍රය) භාවිතය | 17 | දින 01 | 14,948.00 | | දේශීය | කාර්යාල උපකරණ භාවිතය |

7. අනුකූලතා වාර්තාව

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 1 | **පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ /ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ.** | | | |
| 1.1 | වාර්ෂික මූල්‍ය ප්‍රකාශ | අනුකූල වේ | | |
| 1.2 | රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම | අනුකූල වේ | | |
| 1.3 | ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම්) | අනුකූල නොවේ | මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. |
| 1.4 | ගබඩා අත්තිකාරම් ගිණුම් | අනුකූල නොවේ | මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව පිළියෙල කිරීම අවශ්‍ය නොවේ. |
| 1.5 | විශේෂ අත්තිකාරම් ගිණුම් | අනුකූල වේ | | |
| 1.6 | වෙනත් | | | |
| 2 | **පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම(මු.රෙ. 445)** | අනුකූල වේ | | |
| 2.1 | රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.2 | පුද්ගල පඩිනඩි ලේඛන /පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.3 | විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.4 | අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.5 | සියළුම මාසික ගිණුම් සාරාංශ (**CIGAS**) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 2.6 | චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.7 | ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.8 | තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.9 | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම | අනුකූල වේ | | |
| 2.10 | බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 2.11 | උප පත්‍රිකා පොත් ලේඛනය (GA-N20) යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 3 | **මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ.135)** | | | |
| 3.1 | මූල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |
| 3.2 | මූල්‍ය බලතල පවරාදීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම | අනුකූල වේ | | |
| 3.3 | සෑම ගණුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරාදී තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 3.4 | 2014.05.11 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව,රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේ දී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම | අනුකූල වේ | | |
| 4 | **වාර්ෂික සැලසුම් සකස් කිරීම** | | | |
| 4.1 | වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.2 | වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.3 | වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 4.4 | වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අයවැය දෙපාර්තමේන්තුවට (NBD)නියමිත දිනට ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 4.5 | වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 5 | **විගණන විමසුම්** | | | |
| 5.1 | විගණකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට සියළුම විගණන විමසුම් වලට පිළිතුරු ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 6 | **අභ්‍යන්තර විගණනය** | | | |
| 6.1 | මු.රෙ.134(2) DMA 1-2019 අනුව,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම | අනුකූල වේ | | |
| 6.2 | සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම | අනුකූල නොවේ | අංශවලින් පිළිතුරු ලබාදීමට කාලයක් ගැනීම | සිහිකැඳවීම් යවමින් පසු විපරම් කිරීම |
| 6.3 | 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 6.4 | මුදල් රෙගුලාසි 134(3)ප්‍රකාරව සියළුම අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 7 | **විගණන හා කළමනාකරණ කමිටු** | | | |
| 7.1 | DMA චක්‍රලේඛ 1-2019 අනුව, අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 4ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 8 | **වත්කම් කළමනාකරණය** | | | |
| 8.1 | අංක 01/2017දරණ වත්කම් කළමණාකරන චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව වත්කම් මිලදී ගැනීම හා අපහරණය කිරීම් පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.2 | ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වන පරිච්ඡේදය ප්‍රකාරව, එම චක්‍රලේඛයේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිලධාරියෙකු පත් කර එම නිලධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම | අනුකූල වේ | | |
| 8.3 | රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 8.4 | වාර්ෂික භාන්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත,ඌනතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම | අනුකූල වේ | | |
| 8.5 | ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදුකිරීම | අනුකූල වේ | | |
| 9 | **වාහන කළමනාකරණය** | | | |
| 9.1 | සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විකණකාධිපති වෙත ඉදිරිපත් කිරීම | අනුකූල වේ | | |
| 9.2 | වාහන ගර්හිත වී මාස 06ට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම | අනුකූල නොවේ | අපහරණය සිදුකිරිමට අදාල ක්‍රියාවලිය නිසිකලට ක්‍රියාත්මක නොවීම හා අදාල මණ්ඩල මගින් නිසිකලට කටයුතු සිදු නොකිරිම | නිසිකලට වාහන වල තත්වය පරික්ෂා කිරිම හා අවශ්‍ය අවස්ථාවන්හිදී අලුත්වැඩියා කිරිම් කඩිනමින් සිදුකිරිම අදාල අධීක්ෂණ ක්‍රමවේදයක් සැකසීම හා පසුවිපරම් අඛණ්ඩව නොකඩවා සිදු කිරිම |
| 9.3 | වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 9.4 | සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ.103,104,109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 9.5 | 2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව වාහන වල ඉන්දන දහනය වීම නැවත පරීක්ෂා කිරීම | අනුකූල වේ | | |
| 9.6 | කල්බදු කාල සීමාවෙන් අනතුරුව බදු වාහන ලොග් පොත්වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම | අනුකූල වේ | | |
| 10. | **බැංකු ගිණුම් කළමනාකරණය** | | | |
| 10.1 | නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| 10.2 | සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂවල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 10.3 | බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 11. | **ප්‍රතිපාදන උපයෝජනය** | | | |
| 11.1 | සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම | අනුකූල වේ | | |
| 11.2 | මු.රෙ.94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේදී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම | අනුකූල වේ | | |
| 12. | **රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්** | | | |
| 12.1 | සීමාවන් වලට අනුකූල වීම | අනුකූල වේ | | |
| 12.2 | හිඟ හිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදුකර තිබීම | අනුකූල වේ | | |
| 12.3 | වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟ හිටි ණය ශේෂ නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 13. | **පොදු තැන්පත් ගිණුම්** | | | |
| 13.1 | කල් ඉකුත්වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ.571 ප්‍රකාරව කටයුතු කර තිබීම | අනුකූල වේ | | |
| 13.2 | පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 14. | **අග්‍රිම ගිණුම** | | | |
| 14.1 | සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| 14.2 | මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම , එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම | අනුකූල වේ | | |
| 14.3 | මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම | අනුකූල වේ | | |
| 14.4 | අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමග මාසිකව සැසඳුම් කිරීම | අනුකූල වේ | | |
| **15** | **ආදායම් ගිණුම** | | | |
| 15.1 | අදාළ රෙගුලාසිවලට අනුකූලව රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම | අනුකූල වේ | | |
| 15.2 | රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම | අනුකූල වේ | | |
| 15.3 | මු.රෙ.176 අනුව හිග ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **16** | **මානව සම්පත් කළමනාකරණය** | | | |
| 16.1 | අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම | අනුකූල නොවේ | විශේෂ හේතුමත ස්ථාන මාරු වීම් ලබා දීමේදී හා තාවකාලික අනුයුක්ත කිරීම් වලදී කාර්ය මණ්ඩලය ඉක්මවා යාම් සිදු වී ඇත. | ඉදිරියේදී නියමිත ස්ථාන මාරු පටිපාටි ක්‍රමවේද නිසි ආකාරයෙන් පිළිපැදීම තුලින් වලක්වා ගැනීමට අපේක්ෂා කෙරේ. |
| 16.2 | කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම | අනුකූල වේ | | |
| 16.3 | 20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |
| **17** | **මහජනයා වෙත තොරතුරු ලබා දීම** | | | |
| 17.1 | තොරතුරු දැනගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිලධාරියකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම | අනුකූල වේ | | |
| 17.2 | ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පලකිරීමට පහසුකම් සලසා තිබීම | අනුකූල වේ | | |
| 17.3 | තොරතුරු දැනගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම | අනුකූල වේ | | |

| අංකය | අදාළ කරගත යුතු අවශ්‍යතාව | අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ) | අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම | අනුකූල නොවීම අනාගතයේදී වලක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග |
|---|---|---|---|---|
| **18** | **පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම** | | | |
| 18.1 | අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක කර තිබීම | අනුකූල නොවේ | පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කෙරෙමින් පවති. | නිසි කාල රාමුවකින් යුතුව කටයුතු කිරීම මගින් සිදු වන ප්‍රමාදයන් වලක්වා ගැනීම සඳහා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිත වේ |
| 18.2 | එම චක්‍ර ලේඛයේ 2.3 ඡේදය පරිදි පුරවැසි/ සේවාලාභී ප්‍රඥප්තිය සම්පාදන කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | කටයුතු සිදු කෙරෙමින් පවතී. | ඉදිරියේදී සිදුවන ප්‍රමාද දෝෂ වලක්වා ගැනීමට කටයුතු කෙරේ. |
| **19** | **මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම** | | | |
| 19.1 | 2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම | අනුකූල නොවේ | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කරමින් පවතී | මානව සම්පත් සැලැස්ම සම්පාදනය කඩිනමින් සිදු කිරීමට කටයුතු කෙරේ. |
| 19.2 | කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 ට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම | අනුකූල නොවේ | එම | එම |
| 19.3 | ඉහත සඳහන් චක්‍ර ලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ථ කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්යසාධන ගිවිසුම් අත්සන් කර තිබීම | අනුකූල නොවේ | එම | එම |
| 19.4 | ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම, ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම, නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියකු පත්කොට තිබීම | අනුකූල නොවේ | එම | එම |
| **20** | **විගණන ඡේදවලට ප්‍රතිචාර දැක්වීම** | | | |
| 20.1 | ඉකුත් වර්ෂ සඳහා විගණකාධිපති විසින් නිකුත් කළ විගණන ඡේද මගින් පෙන්වාදී ඇති අඩුපාඩු නිවැරදි කොට තිබීම | අනුකූල වේ | | |